# ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්

# වාර්ෂික වාර්තාව - 2014

**පෙළගැස්ම** | **පිටුව**


| | | |
|---|---|---|
| 1. | අපගේ දැක්ම/ මෙහෙවර | 01 - 02 |
| 2. | ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගමේ සභාපතිතුමාගේ පණිවිඩය | 03 |
| 3. | ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගමේ අධ්‍යක්‍ෂ මණ්ඩලය | 04 |
| 4. | ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම කෙටියෙන් හඳුනා ගනිමු | 05 |
| 5. | ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගමේ විගණන හා කළමනාකරන කමිටුව සහ ප්‍රසම්පාදන කමිටු | 06 |
| 6. | ත්‍රිපෝෂ ආයතනයේ ඉතිහාසය හා වර්තමාන ප්‍රගතිය | 07 - 08 |
| 7. | මානව සම්පත් විශ්ලේෂණය | 09 - 10 |
| 8. | ලියාපදිංචි සැපයුම්කරුවන් පිළිබඳ විස්තර | 11 |
| 9. | නිෂ්පාදන තොරතුරු හා අපේක්‍ෂිත ඉලක්ක | 12 - 16 |
| 10. | ත්‍රිපෝෂ බෙදාහැරීමේ ක්‍රියාවලිය සහ තොරතුරු | 17 - 20 |
| 11. | අවසන් ඉලක්කය | 21 |
| 12. | 2014 වර්ෂය තුළ අත් කරගත් ජයග්‍රහණ හා මුහුණ දීමට සිදු වූ ගැටළු | 22 - 23 |
| 13. | ස්තුතිය | 24 |
| 14. | විගණන වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශනය | 25 - 50 |
| 15. | කළමනාකරන ලිපිය | 51 - 56 |

# අපගේ දැක්ම

ශ්‍රී ලාංකේය පොදු ජනතාව

මන්දපෝෂණයෙන් තොර

සෞභාග්‍යමත් අභිමානවත්

නිරෝගිමත් පෝෂිත

ජාතියක් බවට පත් කිරීම

# අපගේ මෙහෙවර

ආශ්චර්ය සපිරි හෙට දවස ලෝකය දිනවන
අප මාතෘ භූමියෙහි
සෞභාග්‍යමත්, තෙදවත්, ගුණවත්
ශ්‍රී ලාංකේය ජාතික අනාගතය උදෙසා
රාජ්‍ය භාණ්ඩාගාරයේ අනු දැනුමැතිව
සෞඛ්‍ය අමාත්‍යාංශයේ සහාය, අධීක්ෂණය පරිපූර්ණව,
ස්වදේශීය ගොවියා බලසතු කරන
සැපයුම්කාරක බලමුළු සවි ගන්වා
උසස් නියමානුකූල ප්‍රමිති ගුණ පෝෂිත
ත්‍රිපෝෂ අතුරු ආහාරය
මනාව සෞඛ්‍ය ආරක්ෂිතව සාදවා, අසුරා, නිමවා,
සුවගුණ අපේක්ෂිත
ප්‍රතිලාභී ජන හිත සුව පිණිස ම
අඛණ්ඩව සපයා ප්‍රදානය කිරීම ද
සම්භාව්‍ය සේවා අභිමානයෙන් ඇප කැප වූ
මහ ක්‍රියාන්විත මෙහෙයුමකින්
දේශය ද - විශ්වය ද
ජය ගන්නා
යහපත් ත්‍රිපෝෂ පවුලක් වීම ද
විශ්වවීය සෞඛ්‍ය දර්ශක ඉලක්ක සපුරන
සෞඛ්‍ය සම්පන්න ශ්‍රී ලාංකේය ජාතියක පැවැත්ම පිණිස
විශිෂ්ඨ ලෙස කැපවූ ද
පළමු හා එකම දේශීය සමාගම වීම

# ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ් හි සභාපති තුමාගේ පණිවිඩය



ත්‍රිපෝෂ නිෂ්පාදනය සම්බන්ධයෙන් 2014 වර්ෂයේ වාර්තාගත ජයග්‍රහණයක් අත්පත් කර ගැනීමට අපට හැකි විය. මේ දක්වා පැවැති නිෂ්පාදන වාර්තා බිඳහෙලමින්, ත්‍රිපෝෂ නිෂ්පාදනය ඉහළ නංවා ගැනීමට හැකි වීම අප ලැබූ මහඟු ජයග්‍රහණයකි.

ත්‍රිපෝෂ නිෂ්පාදනාගාරයට අවශ්‍ය නව යන්ත්‍ර පද්ධතියක් අලුතින් ස්ථාපනය කොට නිෂ්පාදනය තව තවත් ඉහළ නංවා, අතිරික්ත නිෂ්පාදන වෙළඳපොළට යැවීම කෙරෙහි අපගේ අවධානය යොමු වී ඇත. එවිට ත්‍රිපෝෂ ආයතනය ලාභ ලබන රාජ්‍ය ආයතනයක් බවට පත්වීමට කිසිදු අවහිරයක් නොවනු ඇත.

ඉදිරි වසරවල් සඳහා සැලසුම් සහගත ඉලක්ක සාක්ෂාත් කර ගනිමින් ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ් ආයතනය ලාභ ලබන ආදර්ශමත් රාජ්‍ය ආයතනයක් ලෙසින් පෙරට යෑමට අවශ්‍ය කටයුතු සම්පාදනය සඳහා අප වෙහෙසෙන්නෙමු. මෙම ආයතනයේ අභිවෘද්ධිය වෙනුවෙන් අවශ්‍ය දායකත්වය සපයන සෑම සියලු ම පුද්ගලයින් හා අංශ වෙත ගෞරව ප්‍රණාම භක්තිය පළ කර සිටිමි. විශේෂයෙන් ම, සෞඛ්‍ය අමාත්‍ය ගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා විසින් ලබා දුන් උපදෙස් හා මග පෙන්වීම කෙරෙහි අපගේ ගෞරව ස්තුතිය පුද කරන්නෙමු. සෞඛ්‍ය නියෝජ්‍ය අමාත්‍ය, නීතිඥ ගරු ලලිත් දිසානායක මැතිතුමාගෙන් ලද සුවිශේෂී සහාය අප සැම අගය කරන්නෙමු. සෞඛ්‍ය ලේකම්, සුධර්මා කරුණාරත්න මැතිණිය ඇතුළු මුළු මහත් සෞඛ්‍ය අමාත්‍යාංශයීය කාර්ය මණ්ඩලයට අපගේ ගෞරවය පිරිනමමු.

ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ් ආයතනයේ කළමනාකාරිත්වය දරමින්, අවංක හැඟුමින් නිරතුරු ක්‍රියාකරන අධ්‍යක්ෂ මණ්ඩලයට ද, අප සැමගේ ගෞරව ස්තුතිය හිමි විය යුතු ය. අවසන් වශයෙන් ආයතනයේ දියුණුව වෙනුවෙන් ද, නිෂ්පාදන කාර්යයන් මැනවින් පවත්වාගෙන යෑම ප්‍රධාන කොටගත් ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ් ආයතනයේ සෑම තරාතිරමකටම අයත් සමස්ත කාර්ය මණ්ඩලයටම තම කාර්යයන් ප්‍රශස්තව ඉටුකිරීම උදෙසා මාගේ ප්‍රණාමය පුද කර සිටිමි.

කිරාන් අතපත්තු
සභාපති
ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්

# ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්
# අධ්‍යක්ෂ මණ්ඩලය - 2014

- සභාපති, කිරාන් අතපත්තු මහතා

- අධ්‍යක්‍ෂ, වෛද්‍ය පාලිත ගුණරත්න මහිපාල මහතා
  (සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්)

- අධ්‍යක්‍ෂිකා, වෛද්‍ය ශාන්ති ගුණවර්ධන මහත්මිය
  (අධ්‍යක්‍ෂිකා පෝෂණ සම්බන්ධිකරණ අංශය)
  සෞඛ්‍ය අමාත්‍යාංශය

- අධ්‍යක්‍ෂිකා, ඒ.ආර්. අහමඩ් මහත්මිය
  (නීති නිළධාරිණී) සෞඛ්‍ය අමාත්‍යාංශය

- අධ්‍යක්‍ෂිකා, ආචාර්ය ජානකී ගුණරත්න මහත්මිය
  (කාර්මික තාක්ෂණ ආයතන ප්‍රධානි)

- අධ්‍යක්‍ෂිකා, මහාචාර්ය දීප්ති සමරගේ මහත්මිය
  (ළමා රෝග විශේෂඥ)

- අධ්‍යක්‍ෂිකා, රෝස් මේරි ඔල්ගා මහත්මිය
  (අධ්‍යක්‍ෂිකා - ජාතික අය වැය)

- ඩී. ඒ. ඩබ්ලිව්. වනිගසූරිය මහතා
  නිරීක්‍ෂක
  (ප්‍රධාන ගණකාධිකාරී) - සෞඛ්‍ය අමාත්‍යාංශය

- තනුජා ප්‍රියදර්ශනී අල්විස් මහත්මිය
  අධ්‍යක්‍ෂ මණ්ඩල ලේකම්

# ත්‍රිපෝෂ ආයතනය කෙටියෙන් හඳුනා ගනිමු

- ලිපිනය - ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්, තැ.පෙ. 17
  මීගමුව පාර, කපුවත්ත, ජා-ඇල
- දුරකථන - 0112 - 236588
  0112 - 237418
  0112 - 233451
- ෆැක්ස් අංකය - 0112 - 237363
- ඊ-මේල් ලිපිනය - **thriposha@gmail.com**
- අමාත්‍යාංශය - සෞඛ්‍ය අමාත්‍යාංශය
- ආයතනයේ ස්වභාවය - සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ පවතින පූර්ණ රාජ්‍ය සමාගමකි
- සමාගම් ලියාපදිංචි අංකය - PB /3873
- ප්‍රධාන නිෂ්පාදනය - පෝෂණ ගුණයෙන් හා සෞඛ්‍යයෙන් පිරිපුන් ත්‍රිපෝෂ අතිරේක ආහාරය
- බෙදා හැරීමේ මධ්‍යස්ථාන -
  * දිවයින පුරා සෞඛ්‍ය වෛද්‍ය මධ්‍යස්ථාන
  * වතු
  * පරිවාස හා ළමා රක්ෂණ මධ්‍යස්ථාන
- බෙදා හරිනු ලබන ආකාරය - දුම්රිය වැගන් හා ලොරි රථ මගින්
- ප්‍රතිලාභින් -
  * සියලු ම ගර්භනී මව්වරුන්
  * කිරිදෙන මව්වරුන්
  * පෝෂණ අවශ්‍යතා සහිත ළමුන්
  * ඇතැම් රෝගීන්
- මුළු ප්‍රතිලාභින් සංඛ්‍යාව - දශ ලක්ෂයකට ආසන්නය
- බැංකුකරුවන් - ලංකා බැංකුව
- විගණනකරුවන් - කපිල රත්නසිංහ සහ සමාගම
  (වරලත් ගණකාධිකාරිවරු)
  7/3A, ශ්‍රී දේවානන්ද පාර
  නාවින්න, මහරගම

# ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ් හි
# විගණන හා කළමනාකරණ කමිටුව - 2014

- කේ.ඩී.ආර්.ඔල්ගා මිය
  සභාපති - විගණන කළමනාකරණ කමිටුව
  අධ්‍යක්ෂිකා - ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම
  (අධ්‍යක්ෂිකා - ජාතික අය-වැය දෙපාර්තමේන්තුව)
- මහාචාර්ය දීප්ති කුමුදුනී සමරගේ මිය
  සාමාජික - විගණන කළමනාකරණ කමිටුව
  අධ්‍යක්ෂිකා - ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම
- ඩී. ඒ. ඩබ්ලිව්. වනිගසූරිය මහතා
  නිරීක්ෂක - ප්‍රධාන ගණකාධිකාරී
  සෞඛ්‍ය අමාත්‍යාංශය
- රාණි ප්‍රනාන්දු මිය
  නිරීක්ෂක - අභ්‍යන්තර විගණක
  සෞඛ්‍ය අමාත්‍යාංශය

- නීතිඥ තනුජා පී. අල්විස් මිය
  අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්
  ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම
- නිශාන්ත හේවාගම මයා
  මූල්‍ය කළමනාකරු
  ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම
- ආර්.එම්.එන්.කේ.බී. රත්නසිංහ මයා
  කපිල රත්නසිංහ සහ සමාගම
  බාහිර විගණක
- එල්.ජේ.එස්. ප්‍රේමචන්ද්‍ර මයා
  අභ්‍යන්තර විගණක
  ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ් කැඳවුම්කරු

## *ප්‍රධාන ප්‍රසම්පාදන කමිටුව*
## *(රුපියල් මිලියන 50 දක්වා)*

- සභාපති
  ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම
- සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
  සෞඛ්‍ය අමාත්‍යාංශය
- ප්‍රධාන ගණකාධිකාරී
  ධීවර අමාත්‍යාංශය

## *සුළු ප්‍රසම්පාදන කමිටුව*
## *(රුපියල් මිලියන 02 දක්වා)*

- සභාපති
  ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම
- ජ්‍යෙෂ්ඨ කළමනාකරු (මෙහෙයුම්)
  ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම
- ජ්‍යෙෂ්ඨ කළමනාකරු (මානව සම්පත් හා නීති)
  ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම

# ත්‍රිපෝෂ ආයතනයේ ඉතිහාසය හා වර්තමාන ප්‍රගතිය

ත්‍රිපෝෂ ආයතනයේ කළමනාකරණ කටයුතු සෞඛ්‍ය අමාත්‍යාංශයට 1976 වර්ෂයේ දී පැවරුණි. කළමනාකරණ කාර්යයන් සඳහා ටෙන්ඩර් කැඳවන ලද අතර, ඒ සඳහා ලංකා දුම්කොළ සමාගම තෝරා ගනු ලැබී ය. එතැන් සිට 2010 වර්ෂය දක්වා ම මෙහි පාලන කටයුතු ලංකා දුම්කොළ සමාගම විසින් සිදු කරන ලදි. මෙම ව්‍යාපෘතිය සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයේ දායකත්වය වඩාත් ළං කරමින් ත්‍රිපෝෂ කර්මාන්ත ශාලාවේ නඩත්තු වියදම් ප්‍රතිපූර්ණය කිරීමේ කටයුතු 1987 වර්ෂයේ සිට සිදු විය. එමෙන්ම ත්‍රිපෝෂ කර්මාන්තශාලාව සතු භූමි භාගය යන්ත්‍රෝපකරණ හා අනෙකුත් සම්පත් සෞඛ්‍ය අමාත්‍යාංශයට අයත් විය.

රටේ මන්දපෝෂණය තුරන් කරලීමේ ජාතික වැඩසටහන වඩාත් බලගතු කිරීමේ අරමුණින් ත්‍රිපෝෂ ආයතනය රජයට පවරාගෙන එහි නිෂ්පාදන වැඩි දියුණු කිරීමට රජයේ අවධානය යොමු විය. සෞඛ්‍ය අමාත්‍ය ගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශයක් සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබීමෙන් පසු 2010.09.17 දින සිට රජය සතු පූර්ණ රාජ්‍ය සමාගමක් ලෙසින් මෙම ත්‍රිපෝෂ ආයතනය "ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්" නමින් සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ ස්ථාපිත විය. අංක පී.බී./3873 යටතේ සෞඛ්‍ය අමාත්‍යාංශයට අනුබද්ධිත ආයතනයක් ලෙසින් සමාගම් රෙජිස්ට්‍රාර්වරයා යටතේ නව සමාගම ලියා පදිංචි කරන ලදි. ඉන්පසු 2011.01.07 දින සිට සාමාජිකයින් 07 දෙනෙකුගෙන් සමන්විත නව කළමනාකරණ මණ්ඩලයක් යටතේ ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ් හි කටයුතු ආරම්භ විය.

## නිෂ්පාදන ප්‍රගතිය

2011 වර්ෂයේ රජයට පවරා ගන්නා අවස්ථාවේදී ශ්‍රී ලංකාව තුළ ත්‍රිපෝෂ ලැබීමට හිමිකම ඇති සම්පූර්ණ මසක ප්‍රතිලාභීන් සංඛ්‍යාව 928,000ක් වේ. මෙම ප්‍රතිලාභීන්,

- සියලු ම ගර්භනී මව්වරුන්
- සියලු ම කිරිදෙන මව්වරුන් (ළදරුවාට මාස 06ක් ගත වනතුරු)
- මන්ද පෝෂණයෙන් පෙළෙන මාස 06ට වැඩි ළදරුවන් සහ අවුරුදු 05ට අඩු පෙර පාසල් ළදරුවන්
- බර අනුව ළමා වර්ධක සටහනේ 3වන ශතක රේඛාවට පහළින් සිටින ළමුන්
- ඉහත කාණ්ඩයට අයත් රෝහල්ගත රෝගීන් යන අයගෙන් සමන්විත වේ.

ඉහත කී ත්‍රිපෝෂ ප්‍රතිලාභීන් වෙත සම්පූර්ණයෙන් මසකට අවශ්‍ය ත්‍රිපෝෂ සැපයීමට මසකට ත්‍රිපෝෂ මෙ.ටො. 1,392ක් නිෂ්පාදනය කළ යුතු වේ. 2010 සැප්තැම්බර් මාසය දක්වා ත්‍රිපෝෂ ආයතනය රජයට පවරා ගැනීමට පෙර මසක නිෂ්පාදනය මෙ.ටො. 1,000ක් විය. 2010 සැප්තැම්බර් මස සමාගම රජයට පවරා ගැනීමත් සමග නිෂ්පාදනයේ විශාල වැඩිවීමක් සිදු විය. නවීන යන්ත්‍රසූත්‍ර ස්ථාපනය හා සේවක දිරි ගැන්වීම් ආදිය මෙම නිෂ්පාදන ඉහළ යාමට හේතු විය. ඒ අනුව 2011 නොවැම්බර් මාසය වන විට මසක නිෂ්පාදනය මෙ.ටො. 1,300ක් දක්වා ඉහළ නැංවීමට හැකි වූ අතර, එය සම්පූර්ණ අවශ්‍යතාවයේ ප්‍රතිශතයක් ලෙසින් 94%කි.
දිවයිනේ 928,000ක් වූ සම්පූර්ණ ප්‍රතිලාභී අවශ්‍යතාවය සපුරාලීමට එනම් 100%ක ප්‍රතිශතයක් කරා ළඟා වීමට තවත් අවශ්‍යව පැවැතියේ මෙ.ටො. 92ක් පමණි. යුද්ධය

නිම වීම නිසා සංවර්ධනයවන ප්‍රදේශවල ප්‍රතිලාභීන් ද ගණනය කිරීමෙන් පසු 2014 වර්ෂයේ මාසික ප්‍රතිලාභී සංඛ්‍යාව මිලියන 1.3ක් බවට ගණන් බලා ඇති අතර, ඒ සඳහා මසක නිෂ්පාදන අවශ්‍යතාවය මෙ.ටො. 1,950ක් වනු ඇත. මෙම අවශ්‍යතා සාක්ෂාත් කර ගැනීම වාර්තමාන ඉලක්කය වේ. රජයේ වැඩපිළිවෙල යටතේ ත්‍රිපෝෂ නිෂ්පාදන අවශ්‍යතාවය 100%ක් කරා ළඟා වීමට 2014 වනවිට මිලියන 1.3ක් වූ සම්පූර්ණ ප්‍රතිලාභීන් සඳහා අවශ්‍ය වන ත්‍රිපෝෂ මෙ.ටො. 1,950ක් නිෂ්පාදනය කිරීම ඉතා පහසු ඉලක්කයක් වනුයේ පහත සඳහන් වැඩි දියුණු කිරීම් මේවනවිටත් නිම වෙමින් පවතින නිසා ය.

## ඉලක්ක සපුරා ගැනීම සඳහා දියත් කර ඇති වැඩපිළිවෙල

ත්‍රිපෝෂ නිෂ්පාදනය දෙගුණ කිරීම සඳහා අවශ්‍ය යන්ත්‍ර මිල දී ගැනීමට මහා භාණ්ඩාගාරය විසින් සෘජුව ත්‍රිපෝෂ සමාගම වෙත රුපියල් මිලියන 141ක් ලබා දීමට එකඟ වී තිබීම සහ ඉන් මිලියන 70ක් මේවනවිට වෙන් කර දී ඇති අතර, යන්ත්‍ර මිල දී ගැනීම සඳහා අවශ්‍ය කටයුතු ආරම්භ කිරීම.

නව යන්ත්‍රසූත්‍ර සවි කිරීමෙන් පසු ත්‍රිපෝෂ නිෂ්පාදනය දෙගුණ කිරීමට බලාපොරොත්තු වනු ඇත. ඉන් පසු 2015 වර්ෂයේ මිලියන 1.3 සම්පූර්ණ ප්‍රතිලාභීන් සංඛ්‍යාව වෙත ත්‍රිපෝෂ ලබා දීමට හැකි වනු ඇත. මුළු රටේ ම ත්‍රිපෝෂ ප්‍රතිලාභීන්ට අවශ්‍ය ත්‍රිපෝෂ ලබා දී අතිරික්තය දේශීය වෙළඳපොළට නිකුත් කිරීම ආයතනයේ මීළඟ ජයග්‍රාහී ඉලක්කය වනු ඇත.

# මුදල් අමාත්‍යාංශයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත සේවා ගණන, තනතුරු හා අනුමත සේවක සංඛ්‍යාව

| | | | |
|---|---|---|---|
| 01. | ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන් | | |
| | • ජ්‍යෙෂ්ඨ කළමනාකරු (මෙහෙයුම්) | 01 | |
| | • ජ්‍යෙෂ්ඨ කළමනාකරු (මානව සම්පත් හා නීති) | 01 | 02 |
| 02. | මධ්‍යම මට්ටමේ කළමනාකරුවන් | 01 | |
| | • කළමනාකරු (ඉංජිනේරු හා නිෂ්පාදන සේවා) | 01 | |
| | • කළමනාකරු (තත්ත්ව පාලන) | 01 | 03 |
| | • කළමනාකරු (මුදල්) | | |
| 03. | කනිෂ්ඨ කළමනාකරුවන් | | |
| | • බෙදාහැරීමේ නිලධාරී | 01 | |
| | • අභ්‍යන්තර විගණක නිලධාරී | 01 | |
| | • මුදල් නිලධාරී | 01 | |
| | • සැපයීම් නිලධාරී | 01 | |
| | • ගුදම් ගබඩා නිලධාරී | 01 | |
| | • නිෂ්පාදන නිලධාරී | 01 | |
| | • පරිපාලන නිලධාරී | 01 | |
| | • ගබඩා නිලධාරී | 01 | 08 |
| 04. | කළමනාකරණ සහකාර (තාක්ෂණ) | | 03 |
| 05. | කළමනාකරණ සහකාර (තාක්ෂණ නොවන) | | 13 |
| 06. | ප්‍රාථමික සේවා | | |
| | ප්‍රාථමික සේවා (ශිල්පීය) | | |
| | • රියදුරු | 05 | |
| | • විදුලි කාර්මික | 03 | 08 |
| ප්‍රාථමික සේවා (අර්ධ ශිල්පීය) | | | |
| | • බොයිලේරුකරුවන් | 03 | |
| | • පිටර්වරුන් | 03 | |
| | • ලේත් යන්ත්‍රකරුවන් | 02 | |
| | • යන්ත්‍ර ක්‍රියාකරු | 22 | |
| | • තත්ත්ව පරීක්ෂක | 07 | |
| | • ගිනි නිවීමේ උපස්ථායක | 01 | 38 |
| ප්‍රාථමික සේවා (ශිල්පීය නොවන) | | | |
| | • උද්‍යානකරු | 02 | |
| | • කම්කරු/කාර්යාල සහායක | 01 | |
| | • සාමාන්‍ය කම්කරු | 111 | |
| | • කම්කරු පාලිකා | 01 | 115 |
| එකතුව | | | 190 |

# අපගේ කණ්ඩායම සේවා අනුව විහිදී ඇති ආකාරය මෙසේය

- නිෂ්පාදනාගාරය
  (කණ්ඩායමට ඇතුළත් පිරිස 170)

| | තනතුරු | සංඛ්‍යාව | |
|---|---|---|---|
| 01. | ජ්‍යෙෂ්ඨ කළමනාකරු (මෙහෙයුම්) | 01 | |
| 02. | කළමනාකරු (ඉංජිනේරු සේවා හා නිෂ්පාදන) | 01 | |
| 03. | කළමනාකරු (තත්ත්ව ආරක්ෂක) | 01 | |
| 04. | කළමනාකරු (නිෂ්පාදන) | 01 | |
| 05. | නිෂ්පාදන නිලධාරීන් | 03 | |
| 06. | ගබඩා නිලධාරීන් | 02 | |
| 07. | බෙදාහැරීමේ නිලධාරීන් | 01 | |
| 08. | කළමනාකරණ සහාකාරවරුන් | 07 | |
| 09. | විදුලි කාර්මිකයින් | 03 | |
| 10. | ගිනි නිවීමේ උපස්ථායකයින් | 01 | |
| 11. | තත්ත්ව පරීක්ෂකයින් | 07 | |
| 12. | යන්ත්‍ර ක්‍රියාකරුවන් | 22 | |
| 13. | ලේත් යන්ත්‍රකරුවන් | 02 | |
| 14. | පිටර්වරුන් | 03 | |
| 15. | බොයිලේරුකරුවන් | 03 | |
| 16. | සාමාන්‍ය කම්කරුවන් | 112 | |
| | | | 170 |

- පරිපාලන, ගිණුම් හා වෙනත් අංශ
  (කණ්ඩායමට ඇතුළත් පිරිස 20)

| | තනතුරු | සංඛ්‍යාව | |
|---|---|---|---|
| 01. | ජ්‍යෙෂ්ඨ කළමනාකරු (මානව සම්පත් හා නීති) | 01 | |
| 02. | කළමනාකරු (මුදල්) | 01 | |
| 03. | මුදල් නිලධාරී | 01 | |
| 04. | අභ්‍යන්තර විගණන නිලධාරී | 01 | |
| 05. | පරිපාලන නිලධාරී | 01 | |
| 06. | සැපයුම් නිලධාරී | 01 | |
| 07. | කළමනාකරණ සහාකාරවරුන් | 06 | |
| 08. | රියදුරන් | 05 | |
| 09. | කාර්යාල සහායක | 01 | |
| 10. | උද්‍යානකරු | 02 | |
| | | | 20 |
| | | | 190 |

# 2014 වර්ෂයේ ටෙන්ඩර් පටිපාටිය අනුගමනය කරමින් ලියාපදිංචි කර ගන්නා සැපයුම්කරුවන් පිළිබඳ විස්තර

සෝයා බෝංචි හා බඩඉරිඟු

1. ගොවි මධ්‍යස්ථානය
   මිගලෑව
   නො: 367
   03 මහළ ඩැම් වීදිය
   කොළඹ 12

2. ජනතා ඒකාබද්ධ ගොවි සමාගම
   අනුරාධපුරය
   නො: 17/10, ඔලියමුල්ල
   වත්තල

3. ඒකාබද්ධ ගොවි සංවිධානය
   අම්පාර
   නො: 169, දුටු ගැමුණු මාවත
   පැලියගොඩ

4. කේ.එස්.ටී. එවර්ග්‍රීන් (ප්‍රයිවට්) ලිට්ටඩ්
   නො: 583
   සාන්ත ජුඩ් මාවත
   රිලවුල්ල
   කඳාන

5. සී.අයි.සී. සීඩ්ස් (ප්‍රයිවට්) ලිට්ටඩ්
   නො : 205 1/1
   ඩී.ආර්. විජේවර්ධන මාවත
   කොළඹ 10

කිරි පිටි
මිල්කෝ සමාගම
නො: 45
නාවල පාර
නාරාහේන්පිට

විටමින්
ජේ.කේ. ට්‍රේඩ්ලින්ක් (ප්‍රයිවට්) ලිමිටඩ්
නො: 44
තලවතුගොඩ පාර
පිටකෝට්ටේ

ඛනිජ ලවණ
වික්‍රමරත්න පුද්ගලික සමාගම
නො: 231
ඩැම් වීදිය
කොළඹ 12

ක්‍රාෆ්ට් පෙපර්
සිලෝන් පෙපර් සැක්ස්
නො: 257
ග්‍රෑන්ඩ් පාස් පාර
කොළඹ 14

පොලිතින්
ටෆ්ලයින් ලිමිටඩ්
නො: 188
හයිලෙවල් පාර
මීගොඩ

2010 වසරේ සිට 2014 වසර දක්වා ත්‍රිපෝෂ නිෂ්පාදනය (මාස්ටර් බෑග්ස්වලින්)

| මාසය | 2010 | 2011 | 2012 | 2013 | 2014 |
|---|---|---|---|---|---|
| ජනවාරි | 16,697 | 41,752 | 37,689 | 43,026 | 40,316 |
| පෙබරවාරි | 31,038 | 45,161 | 47,414 | 44,109 | 47,708 |
| මාර්තු | 29,693 | 48,028 | 47,198 | 44,701 | 56,917 |
| අප්‍රේල් | 16,291 | 37,573 | 30,336 | 22,018 | 38,492 |
| මැයි | 25,167 | 48,002 | 43,425 | 30,069 | 56,456 |
| ජුනි | 36,216 | 37,860 | 45,936 | 33,370 | 51,654 |
| ජුලි | 34,759 | 38,090 | 45,736 | 60,285 | 57,309 |
| අගෝස්තු | 30,890 | 47,810 | 47,236 | 55,429 | 57,677 |
| සැප්තැම්බර් | 42,190 | 50,428 | 44,645 | 58,712 | 57,621 |
| ඔක්තෝබර් | 47,765 | 56,913 | 48,009 | 49,958 | 58,522 |
| නොවැම්බර් | 49,361 | 51,026 | 15,308 | 42,348 | 56,324 |
| දෙසැම්බර් | 29,929 | 10,304 | 37,520 | 18,238 | 42,072 |
| මාස්ටර් බෑග්ස් | **389,996** | 512,947 | 490,452 | 502,263 | 621,068 |
| මෙට්‍රික් ටොන් | **8,775** | **11,541** | 11,035 | 11,300 | 13,974 |

2010 වර්ෂයේ ප්‍රස්තාර ගත නිෂ්පාදන දත්ත (මාස්ටර් බෑග්ස්වලින්)



2011 වර්ෂයේ ප්‍රස්තාර ගත නිෂ්පාදන දත්ත (මාස්ටර් බැග්ස්වලින්)




2012 වර්ෂයේ ප්‍රස්තාර ගත නිෂ්පාදන දත්ත (මාස්ටර් බැග්ස්වලින්)



2013 වර්ෂයේ ප්‍රස්තාර ගත නිෂ්පාදන දත්ත (මාස්ටර් බැග්ස්වලින්)




2014 වර්ෂයේ ප්‍රස්තාර ගත නිෂ්පාදන දත්ත (මාස්ටර් බැග්ස්වලින්)




ඉතිහාසයේ ඉහළම නිෂ්පාදනයක් පැවති වසර 2014 වර්ෂයයි.

ඉහත තොරතුරු අනුව වසර 40ක තරම් වන නිෂ්පාදන ඉතිහාසයේ වැඩිම වාර්ෂික නිෂ්පාදනය 2014 වර්ෂයේ වාර්තාගත වී ඇති අතර එය මාස්ටර් බැග් 621,068 කි.

2015 අපේක්ෂිත ඉලක්ක

දැනට ක්‍රියාත්මක වන බ්‍රේඩ් යන්ත්‍රය වෙනුවට ඇන්ඩර්සන් යන්ත්‍රයක් ස්ථානගත කිරීමෙන් ඉදිරියේ දී අතිරික්ත නිෂ්පාදනයක් ඇති කළ හැකිවන අතර, එම අතිරික්ත වෙළඳපොළට අලෙවි කිරීම ත්‍රිපෝෂ සමාගමේ කළමනාකාරිත්වයේ සහ සේවක මණ්ඩලයේ ඉලක්කය වේ.

සේවක සුභ සාධනය ඉතා ඉහළ මට්ටමක පවත්වාගෙන යමින් රැකියා සුරක්ෂිතතාවය සහ රාජ්‍ය රැකවරණය සහිත නව කළමනාකාරිත්වය පිළිබඳ වූ විශ්වාසය හේතු කොට ගෙන පැවති සේවක සංඛ්‍යාවේ හෝ එතෙක් පැවති යන්ත්‍රවල කිසිදු වෙනසක් සිදු නොකොට වසරක් වැනි ඉතා කෙටි කාලයක දී නිෂ්පාදනය 94% දක්වා ඉහළ නැංවීමට හැකි විය. ත්‍රිපෝෂ ව්‍යාපෘතිය රජය සතු සමාගමක් ලෙසට සංස්ථාපනය කිරීමෙන් ආශ්චර්යමත් වූ ප්‍රගතියක ලක්ෂණයන් ලෙසට ආදර්ශයක් ලබා දීමට හැකියාව ලැබීම සතුට දනවන්නකි.

2014 සහ 2015 වර්ෂයන් වල නිෂ්පාදන ප්‍රවර්ධනය පහත අයුරින් ඉහළ නැංවීම ආයතනයේ ඒකායන අපේක්ෂාවයි. එවිට ප්‍රතිලාභි අවශ්‍යතා අනුව බෙදාහැරීමේ හැකියාව ලබා ගනු ඇත.

| මාසය | 2014 | | 2015 | |
|---|---|---|---|---|
| | මාස්ටර් බෑග්ස් | පැකට්ස් | මාස්ටර් බෑග්ස් | පැකට්ස් |
| ජනවාරි | 60,756 | 1,822,680 | 57,012 | 1,710,360 |
| පෙබරවාරි | 60,756 | 1,822,680 | 51,972 | 1,559,160 |
| මාර්තු | 66,156 | 1,984,680 | 60,036 | 1,801,080 |
| අප්‍රේල් | 57,876 | 1,736,280 | 57,348 | 1,720,440 |
| මැයි | 61,116 | 1,833,480 | 63,060 | 1,891,800 |
| ජුනි | 61,476 | 1,844,280 | 60,036 | 1,801,080 |
| ජුලි | 66,516 | 1,995,480 | 60,036 | 1,801,080 |
| අගෝස්තු | 61,476 | 1,844,280 | 60,372 | 1,811,160 |
| සැප්තැම්බර් | 57,876 | 1,736,280 | 60,036 | 1,801,080 |
| ඔක්තෝබර් | 61,116 | 1,833,480 | 62,724 | 1,881,720 |
| නොවැම්බර් | 66,516 | 1,995,480 | 60,372 | 1,811,160 |
| දෙසැම්බර් | 59,676 | 1,790,280 | 57,348 | 1,720,440 |
| එකතුව | 741,312 | 22,239,360 | 710,352 | 21,310,560 |

දත්ත හා තොරතුරු

ත්‍රිපෝෂ නිෂ්පාදනය හා බෙදාහැරීම ආදිය පිළිබඳ දත්ත ක්ෂණිකව හා පහසුවෙන් ලබාගත හැකි පරිදි මෘදුකාංග (Software) ස්ථාපිත කිරීම වැදගත් වන බැවින් ඉදිරියේ දී එය සිදු කිරීමට නියමිත ය.

## නව යන්ත්‍රසූත්‍ර භාවිතය හා නිෂ්පාදනාගාරයේ ධාරිතාවය ඉහළ නැංවීම

ලෝක ආහාර සංවිධානය මගින් ත්‍රිපෝෂ නිෂ්පාදනය සඳහා මිලියන 72ක් වටිනා යන්ත්‍ර ලබා දී ඇති අතර, නිෂ්පාදන අඩාලවීමකින් තොරව පවත්වාගෙන යාම සඳහා එම යන්ත්‍ර උපයෝගී කර ගැනීම 2012 වර්ෂයේ දී සිදු විය. රුපියල් මිලියන 05ක් වටිනා ඇසුරුම් යන්ත්‍රයක් සඳහා ද මූල්‍ය ප්‍රතිපාදන, ලෝක ආහාර සංවිධානය මගින් ලබා දී ඇති අතර, 2012 ජනවාරි මස සිට එම යන්ත්‍ර භාවිතයට ගෙන ඇත.

## නිෂ්පාදන අමුද්‍රව්‍ය තව තවත් මිල දී ගැනීම

දේශිය ගොවියා තව තවත් සුරක්ෂිත කිරීමේ අරමුණ පෙරදැරිව ඔවුන්ගේ නිෂ්පාදන ගොවි සංවිධාන වෙතින් ත්‍රිපෝෂ ආයතනයට සපයා ගැනීමට තව දුරටත් කටයුතු කරනු ඇත. මේ අනුව මීගලෑව, අනුරාධපුරය, අම්පාර හා හුරුළුවැව ගොවි සංවිධාන මගින් සෝයා බෝංචි හා බඩඉරිඟු නිෂ්පාදන ලබා ගැනීම නිසා එම ගොවි සංවිධාන හා අනුබද්ධ 8,000ක පමණවන මහවැලි හා පාරම්පාරික ගොවි පවුල්වලට සෘජුවම ආයතනය හා සම්බන්ධ වීමේ හැකියාව ලැබෙනු ඇත. මේ සඳහා ප්‍රාදේශිය සංවර්ධන බැංකු, ප්‍රධාන වාණිජ බැංකු මගින් අදාළ ගොවි සංවිධානවලට අවශ්‍ය මූල්‍ය පහසුකම් සපයනු ඇත.

# ත්‍රිපෝෂ බෙදා හැරීමේ ක්‍රියාවලිය

ත්‍රිපෝෂ කර්මාන්ත ශාලාව (ජා-ඇල)



බෙදාහැරීමේ කටයුතු කිරීම (ලොරි රථ මගින් හා දුම්රිය වැගන් මගින්)







ප්‍රාදේශිය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්

සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි

සෞඛ්‍ය මධ්‍යස්ථාන (සායන)

පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනිය

වතු

ළමා මධ්‍යස්ථාන







ත්‍රිපෝෂ ප්‍රතිලාභීන්

ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම මගින් ත්‍රිපෝෂ නිෂ්පාදනය සිදු කර සෞඛ්‍ය අමාත්‍යාංශය හරහා ක්‍රමානුකූලව බෙදාහැරීම් කටයුතු සිදු කරනු ලැබේ.

**ත්‍රිපෝෂ බෙදාහැරීමේ මධ්‍යස්ථාන**

**පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ බල ප්‍රදේශ**

1. මධ්‍යම පළාත
2. නැගෙනහිර පළාත
3. උතුරු මැද පළාත
4. වයඹ පළාත
5. උතුරු පළාත
6. සබරගමුව පළාත
7. දකුණු පළාත
8. ඌව පළාත
9. බස්නාහිර පළාත

**වතු අධිකාරි**

1. නුවර එළිය
2. මාතර
3. හැටන්
4. මාතලේ
5. රත්නපුර
6. ගාල්ල
7. බදුල්ල
8. කෑගල්ල
9. නුවර
10. කළුතර

**වෙනත්**

1. හමුදා රෝහල්
2. නගර සභා
   - මීගමුව
   - කොළඹ
   - මාතලේ
   - ගාල්ල
   - නුවර

**පරිවාස හා ළමා ආරක්ෂණ අධිකාරි**

1. අනුරාධපුරය
2. බත්තරමුල්ල
3. බදුල්ල
4. ගාල්ල
5. යාපනය
6. ත්‍රිකුණාමලය
7. කුරුණෑගල
8. රත්නපුර
9. කෑගල්ල
10. නුවර

**ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ බල ප්‍රදේශ**

1. අම්පාර
2. අනුරාධපුරය
3. බදුල්ල
4. මඩකලපුව
5. කොළඹ
6. ගාල්ල
7. ගම්පහ
8. හම්බන්තොට
9. යාපනය
10. කල්මුණේ
11. කළුතර
12. රත්නපුර
13. ත්‍රිකුණාමලය
14. මහනුවර
15. කෑගල්ල
16. කිලිනොච්චිය
17. කුරුණෑගල
18. මාතලේ
19. මාතර
20. මන්නාරම
21. මොණරාගල
22. නුවර එළිය
23. පොළොන්නරුව
24. පුත්තලම
25. වව්නියාව

**සෞඛ්‍ය වෛද්‍ය නිළධාරි කොට්ඨාශ**

| | | | | | |
|---|---|---|---|---|---|
| 1. අම්පාර | 07 | 10. කල්මුණේ | 13 | 19. මොණරාගල | 11 |
| 2. අනුරාධපුරය | 18 | 11. කළුතර | 13 | 20. නුවර එළිය | 11 |
| 3. බදුල්ල | 15 | 12. නුවර | 21 | 21. පොළොන්නරුව | 07 |
| 4. මඩකලපුව | 13 | 13. කෑගල්ල | 11 | 22. පුත්තලම | 11 |
| 5. කොළඹ | 11 | 14. කිලිනොච්චිය | 04 | 23. රත්නපුර | 17 |
| 6. ගාල්ල | 19 | 15. කුරුණෑගල | 23 | 24. ත්‍රිකුණාමලය | 10 |
| 7. ගම්පහ | 16 | 16. මාතලේ | 12 | 25. වව්නියාව | 04 |
| 8. හම්බන්තොට | 12 | 17. මාතර | 16 | | |
| 9. යාපනය | 11 | 18. මන්නාරම | 03 | | |

# 2014 වර්ෂයේ ත්‍රිපෝෂ බෙදා හැරීමේ තොරතුරු

| ප්‍රාදේශිය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ බල ප්‍රදේශ | ප්‍රතිලාභින් සංඛ්‍යාව | මසකට වෙන් කරනු ලබන ප්‍රමාණය | | |
|---|---|---|---|---|
| | | මව්වරුන්ට | ළමයින්ට | එකතුව |
| අම්පාර | 26,542 | 574 | 1,190 | 1,764 |
| අනුරාධපුරය | 56,505 | 1,256 | 2,521 | 3,777 |
| බදුල්ල | 41,461 | 927 | 1,837 | 2,764 |
| මඩකලපුව | 43,405 | 960 | 1,932 | 2,892 |
| කොළඹ රෝහල | 5,148 | 46 | 178 | 224 |
| කොළඹ නගර සභාව | 9,240 | 330 | 630 | 960 |
| කොළඹ (දකුණ) | 42,553 | 819 | 1,571 | 2,390 |
| ගාල්ල | 47,365 | 1,048 | 2,109 | 3,157 |
| ගම්පහ | 51,159 | 962 | 1,976 | 2,938 |
| හම්බන්තොට | 34,758 | 597 | 1,183 | 1,780 |
| යාපනය | 31,010 | 689 | 1,408 | 2,097 |
| කල්මුණේ | 37,706 | 835 | 1,678 | 2,513 |
| කළුතර | 30,854 | 849 | 1,426 | 2,275 |
| මහනුවර | 59,458 | 1,317 | 2,641 | 3,958 |
| කෑගල්ල | 30,288 | 718 | 1,062 | 1,780 |
| කිලිනොච්චිය | 7,719 | 172 | 514 | 686 |
| කුරුණෑගල | 66,798 | 1,471 | 2,983 | 4,454 |
| මන්නාරම | 7,398 | 163 | 330 | 493 |
| මාතලේ | 31,233 | 546 | 1,308 | 1,854 |
| මාතර | 50,795 | 1,122 | 2,266 | 3,388 |
| මොණරාගල | 29,517 | 707 | 1,410 | 2,117 |
| නුවරඑළිය | 27,191 | 640 | 1,364 | 2,004 |
| පොළොන්නරුව | 32,367 | 625 | 1,534 | 2,159 |
| පුත්තලම | 27,857 | 522 | 921 | 1,443 |
| රත්නපුර | 42,555 | 957 | 1,881 | 2,838 |
| ත්‍රිකුණාමලය | 40,884 | 905 | 1,817 | 2,722 |
| වව්නියාව | 8,290 | 186 | 368 | 554 |
| මුලතිව් | 6,335 | 141 | 281 | 422 |
| එකතුව | 944,047 | 20,084 | 40,319 | 60,403 |

| පරිවාස ළමා රක්ෂණ මධ්‍යස්ථාන | ප්‍රතිලාභින් සංඛ්‍යාව | මසකට වෙන් කරනු ලබන ප්‍රමාණය ළමයින්ට |
|---|---|---|
| 09 | 24,549 | 49,098 |
| එකතුව | 24,549 | 49,098 |

| වතු ප්‍රදේශ | ප්‍රතිලාභින් සංඛ්‍යාව | මසකට වෙන් කරනු ලබන ප්‍රමාණය | | |
|---|---|---|---|---|
| | | මව්වරුන්ට | ළමයින්ට | එකතුව |
| හැටන් | 10,470 | 710 | 1,438 | 2,148 |
| මාතලේ | 2,873 | 180 | 401 | 581 |
| කෑගල්ල | 4,287 | 262 | 634 | 896 |
| මහනුවර | 5,248 | 322 | 713 | 1,035 |
| කළුතර | 2,319 | 164 | 319 | 483 |
| නුවර එළිය | 11,495 | 743 | 1,539 | 2,282 |
| මාතර | 1,042 | 70 | 145 | 215 |
| බදුල්ල | 10,320 | 710 | 1,438 | 2,148 |
| ගාල්ල | 1,062 | 68 | 152 | 220 |
| රත්නපුර | 4,586 | 304 | 621 | 925 |
| එකතුව | 53,702 | 3,533 | 7,400 | 10,933 |

## 2014 වර්ෂයේ ත්‍රිපෝෂ බෙදාහැරීමේ මධ්‍යස්ථාන සංඛ්‍යාව හා ප්‍රතිලාභින්ගේ සංඛ්‍යාව

| | මධ්‍යස්ථාන සංඛ්‍යාව | ප්‍රතිලාභින් සංඛ්‍යාව |
|---|---|---|
| ප්‍රාදේශිය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කොට්ඨාස 26 වෙනුවෙන් | 740 | 926,391 |
| වතු | 447 | 53,702 |
| පරිවාස හා ළමාරක්ෂණ දෙපාර්තමේන්තුවේ ළමා නිවාස | 09 | 24,549 |
| **එකතුව** | 1,196 | 1,004,642 |

# අවසන් ඉලක්කය

මෙම අවශ්‍යතා සපුරාගෙන අවශ්‍ය වැඩි දියුණු කිරීම් ඉදිරි කෙටි කාලය තුළ සම්පූර්ණ වන අතර, මිලියනයකට ආසන්න වූ සම්පූර්ණ ප්‍රතිලාභින් සංඛ්‍යාව වෙත නොඅඩුව ත්‍රිපෝෂ ලබා
 දීමට 100%ක ඉලක්කය කරා ළගා වීම අවසන් ඉලක්කය වනු ඇත.
එමෙන්ම අතිරික්ත නිෂ්පාදනයක් ඇති කිරීම අපේක්ෂා කරනු ලබන අතර එම අතිරික්තය නව මුහුණුවරකින් වෙළදපලය හදුන්වාදි වෙළදපල ඉල්කක ජය ගැනිම ද තවත් එක් අභිප්‍රායකි
මේ අනුව රටේ ප්‍රතිලාභි අවශ්‍යතාවන්ට සරිලන නිෂ්පාදන මට්ටම මේ අයුරින් වැඩි දියුණු කොට යහපත් සේවා තත්ත්වයක් පවත්වාගෙන යෑම සහ වෙළදපලට නිෂ්පාදනය හදුන්වා දි ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ් හි අපේක්ෂාව වන්නේ ය.

# 2014 වර්ෂය තුළ අත්කරගත් ජයග්‍රහණ හා මුහුණ දීමට සිදු වූ ගැටළු

2014 වර්ෂය තුළ අත් කරගත් ජයග්‍රහණයක් වන්නේ මන්දපෝෂණය රටින් තුරන් කිරීමේ අපගේ මූලික පරමාර්ථය සාර්ථක කර ගැනීමට හැකි වීමයි. එනම්, ත්‍රිපෝෂ බෙදාහැරීම තුළින් අනෙක් වර්ෂවලට සාපේක්ෂව මන්දපෝෂණ තත්ත්වය අඩු වී තිබීමයි. උදාහරණයක් ලෙස මොණරාගල දිස්ත්‍රික්කයේ මන්දපෝෂණ ප්‍රතිශතය අඩු වී ඇති බව නියෝජ්‍ය සෞඛ්‍ය අධ්‍යක්ෂ කාර්යාලය මගින් අප වෙත දැනුම් දෙන ලදි.

සාර්ථකත්වය වෙනුවෙන් යෝජනා

1. ක්‍රමවත් බෙදාහැරීමේ ක්‍රියා පිළිවෙතක් අනුගමනය කිරීමේ පහසුව තකා අප ආයතනයට ලොරි රථයක්,
2. ත්‍රිපෝෂ බෙදාහරිනු ලබන ආයතන නිරීක්ෂණය සඳහා නිරීක්ෂණ කමිටුවක් පිහිටුවීම ඉතා වැදගත් ය.

# 2014 වසරේ අප ලද නිෂ්පාදන ජයග්‍රහණ

ත්‍රිපෝෂ නිෂ්පාදන ඉතිහාසයේ ඉහළම නිෂ්පාදනය අත්පත් කර ගැනීමට අපට හැකි විය.

ජයග්‍රහණයේ පසුබිම

- කණ්ඩායමක් ලෙස එක්ව වැඩ කිරීම
- නවීන යන්ත්‍ර අළුතින් භාවිතයට ගැනීම
- වැඩ පිළිබඳ ආකල්ප වැඩිදියුණු කිරීමට

ප්‍රතිඵල

වර්ෂයේ ඉහළම නිෂ්පාදන

මාසික ඉහළම නිෂ්පාදන

දෛනික ඉහළම නිෂ්පාදන

**අපගේ මීළඟ ඉලක්කය වෙළඳපොළ ජයගැනීමයි.**
**අපි එය ජය ගන්නෙමු**

# ස්තුතිය

අපගේ ආයතනයේ ඉහළ සිට පහළටත්, පහළ සිට ඉහළටත් ගලා යන ධූරාවලින් තෘප්තිමත්ව සේවය කරන කාර්ය මණ්ඩලයක් දක්නට ලැබීම මහත් සතුටකි. ආයතනයේ දියුණුවට ඔවුන් ලබා දෙන දායකත්වය අගේ කළ යුතු ය. මෙම ආයතනය සෞඛ්‍ය අමාත්‍යංශය යටතේවන රාජ්‍ය සමාගමක් ලෙසින් ස්ථාපිත කිරීමට අවශ්‍ය කටයුතු සලසා දී සෑමදෙනාම දිරිමත් කොට, අවශ්‍ය උපදෙස්, අනුග්‍රහ ආදිය ලබා දීම පිළිබඳ සෞඛ්‍ය අමාත්‍ය ගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාටද නියෝජ්‍ය සෞඛ්‍ය අමාත්‍ය ගරු නිතිඥ ලලිත් දිසානායක මැතිතුමාටද අපට නිසි උපදෙස් හා අවශ්‍ය අනුමැතියන් නොපමාව ලබා දුන් සෞඛ්‍ය ලේකම් සුධර්මා කරුණාරත්න මහත්මියටත් අපගේ ස්තුතිය පුදකර සිටිමු.

එලෙසින්ම ආයතනයේ කළමනාකාරීත්වය දරමින් අධ්‍යක්ෂ මණ්ඩලයේ සියලු ම මහත්ම, මහත්මීන්ගෙන් ලද සහාය අප සැමට ආශිර්වාදයක්ම විය. එමෙන්ම අපගේ සැපයුම්කරුවන් හා බාහිරව අපට සේවය සලසන සැම කෘතඥ පූර්වකව සිහිපත් කරමු.

අවසන් වශයෙන් මෙම ඉලක්ක ජය ගැනිමට නිරතුරු වෙහෙසෙන ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්හි සමස්ත කාර්ය මණ්ඩලයට ප්‍රණාමය පුදකර සිටිමු.

83/1/2, සුභද්‍රාරාම මාවත,
ගංගොඩවිල, නුගේගොඩ, ශ්‍රී ලංකාව.
දුරකථන අංක : +94 11 2822 164
ෆැක්ස් අංකය : +94 11 2372317
ජංගම දුරකථන අංක : +94 71 6840 945
විද්‍යුත් තැපැල : krc@krathnasinghe.com
වෙබ් අඩවිය : www.krathnasignhe.com

**කපිල රත්නසිංහ සහ සමාගම**
**(වරලත් ගණකාධිකාරිවරුන්)**

**ස්වාධීන විගණන වාර්තාව**

**ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්හි කොටස් හිමිකරුවන් වෙත**

2014 දෙසැම්බර් මස 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, ආදායම් හා වියදම් ප්‍රකාශය, මුදල් සමානයන් වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය, ඉන් පසුව අවසන් වූ වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය සහ සුවිශේෂී ගිණුම්කරණ ප්‍රතිපත්තීන් හා වෙනත් විස්තර කිරීමේ සටහන්හි සාරාංශයක් ඇතුලත්, ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්හි සම්බන්ධිත මූල්‍ය ප්‍රකාශ අප විසින් විගණනය කරනු ලැබ ඇත.

**මූල්‍ය ප්‍රකාශය සඳහා මණ්ඩලය සතු වගකීම**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සත්‍ය සහ සාධාරණ මතයක් ඉදිරිපත් කළ යුතු සහ වංචාවකින් හෝ අත්වැරදීමකින් හෝ ප්‍රධාන පෙළේ සාවද්‍ය ලෙස ප්‍රකාශගත කිරීමක් සිදු නොවන අයුරින් මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමට අවශ්‍ය යැයි මණ්ඩලය නිර්ණය කරනු ලබන විට එවැනි අභ්‍යන්තර පාලනය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය ("මණ්ඩලය") විසින් මෙම මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමෙහි ලා වග කිව යුතු වේ.

**විගණනකරුගේ වගකීම**

අපගේ විගණනය මත පදනම්ව, මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහසක් ඉදිරිපත් කිරීම අපගේ වගකීම වේ. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ගේ අවශ්‍යතාවන්ට අනුව අප විසින් අපගේ විගණනය සිදු කරනු ලැබූ අතර, අප විසින් ආචාරධර්ම හා අනුගතව ක්‍රියා කරනු ලබන අතර, මෙම මූල්‍ය ප්‍රකාශ ප්‍රධාන පෙළේ සාවද්‍ය ලෙස ප්‍රකාශගතකිරීම්වලින් තොර වේද යන්න පිළිබඳව සාධාරණ සහතික වීමක් ලබා ගැනීම පිණිස සැලසුම් සකස් කර, විගණනය සිදු කරනු ලැබේ.

විගණන කාර්යයක්, මූල්‍ය ප්‍රකාශයන්හි වටිනාකම් සහ හෙළිදරව් කිරීම් පිළිබඳ විගණන සාක්ෂි ලබා ගැනීම සඳහා ක්‍රියාත්මක කරනු ලබන ක්‍රමවේදවලින් සමන්විත වේ. විගණනකරුගේ නිශ්චය කිරීම මත තෝරා ගනු ලබන ක්‍රමවේද තීරණය කෙරෙනු ලබන අතර, ඊට, වංචාවකින් හෝ අත්වැරදීමකින් හෝ මූල්‍ය ප්‍රකාශනවල ප්‍රධාන පෙළේ සාවද්‍ය ලෙස ප්‍රකාශගත කිරීමේ අවදානම් ඇගයීම ඇතුලත් වේ. එම අවදානම් ඇගයීම් සකස් කිරීමේදී, ආයතනයේ මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමට අදාල අභ්‍යන්තර පාලනය විගණකවරයා විසින් සලකා බලනු ලබන අතර, එමගින් අවස්ථාවට යෝග්‍ය පරිදි විගණන ක්‍රමවේද සැලසුම් කිරීම පිණිස, සත්‍ය සහ සාධාරණ මතයක් ඉදිරිපත් කළ යුතු නමුත්, ආයතනයේ අභ්‍යන්තර පාලනයෙහි ඵලදායීත්වය පිළිබඳව අදහසක් පල කිරීම අරමුණුගත නොවේ. භාවිත කරනු ලබන ගිණුම්කරණ ප්‍රතිපත්තීන්හි යෝග්‍යතාව සහ මණ්ඩලය විසින් ඉදිරිපත් කරනු ලබන ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණීය බව මෙන්ම මූල්‍ය ප්‍රකාශයන්හි සමස්ත ඉදිරිපත් කිරීම ඇගයීම ද විගණනයක් තුල අන්තර්ගත වේ.

අපගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම පිණිස, අප විසින් ලබා ගත් විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ යෝග්‍ය බව අපි විශ්වාස කරන්නෙමු.

**මතය**

අපගේ මතයට අනුව, මෙම මූල්‍ය ප්‍රකාශන මගින් 2014 දෙසැම්බර් 31 දිනට අවසන් සමාගමේ මූල්‍ය තත්ත්වයේ සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් හා අනුගතව, ඉන් පසු අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය සහ මුදල් ප්‍රවාහ තත්ත්වය පිළිබඳ සත්‍ය හා සාධාරණ දැක්මක් ලබා දෙයි.

වෙනත් නෛතික සහ නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2007 අංක 07 දරන සමාගම් පනතෙහි 163(2) වගන්තියෙහි දක්වා ඇති පරිදි, අප විසින් පහත සඳහන් කරුණු ප්‍රකාශ කර සිටිමු :

(අ) අදහස් ඉදිරිපත් කිරීමේ පදනම සහ විගණනයේ විෂය පථය සහ සීමාවන් පහත සඳහන් පරිදි වේ.

(ආ) අපගේ මතයට අනුව,

- විගණනය සඳහා අවශ්‍ය වූ සියලුම තොරතුරු හා පැහැදිලිකිරීම් අප විසින් ලබා ගෙන ඇති අතර, බාහිර පරීක්ෂණවලින් පෙනී යන පරිදි, සමාගම විසින් නිසියාකාරව ගිණුම් වාර්තාගතකිරීම් පවත්වා ගෙන යනු ලැබ ඇත.
- සමාගමේ මූල්‍ය ප්‍රකාශන මඟින් 2014 දෙසැම්බර් 31 දිනට අවසන් සමාගමේ මූල්‍ය තත්ත්වයේ සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් හා අනුගතව, ඉන් පසු අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය සහ මුදල් ප්‍රවාහ තත්ත්වය පිළිබඳ සත්‍ය හා සාධාරණ දැක්මක් ලබා දෙයි.
- සමාගමේ මූල්‍ය ප්‍රකාශන, 2007 අංක 07 දරන සමාගම් පනතෙහි 151 වගන්තියේ දක්වා ඇති අවශ්‍යතා හා අනුකූල වේ.

වරලත් ගණකාධිකාරිවරුන්
කොළඹ
දිනය : **2016** මැයි මස **11** වන දින

ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්

2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් හා වියදම් ප්‍රකාශය

| | | 2014/12/31 | 2013/12/31 |
|---|---|---|---|
| | | රු. ශත | රු. |
| වර්ෂය තුල වියදම් ප්‍රතිපූර්ණය කිරීම | 02. | 1,776,560,231.70 | 1,381,201,496 |
| අඩු කිරීම : නිෂ්පාදන පිරිවැය | 03. | (1,604,546,992.49) | (1,382,271,151) |
| | | **172,013,239.21** | **(1,069,655)** |
| | | | |
| එකතු කිරීම : වෙනත් ආදායම් | 04. | 21,087,871.63 | 24,622,143 |
| | | **193,101,110.84** | 23,552,488 |
| අඩු කිරීම : වියදම් | | | |
| පරිපාලන වියදම් | | (36,360,371.05) | (33,211,216) |
| බෙදාහැරීමේ පිරිවැය | | (7,232,959.00) | (8,986,705) |
| මූල්‍ය සහ වෙනත් වියදම් | | (1,311,289.70) | (1,209,922) |
| | | **(44,904,619.75)** | (43,407,843) |
| | | | |
| වර්ෂය සඳහා වියදම ඉක්මවූ ආදායම | 05. | **148,196,491.09** | (19,855,354) |
| | | | |
| **වෙනත් විස්තරාත්මක ආදායම්** | | | |
| | | | |
| විශ්‍රාමික ප්‍රතිලාභ හිමිකම නැවත හැරවීම | | 411,927.50 | - |
| | | | |
| සමස්ත වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම | | **148,608,418.59** | (19,855,354) |

මෙම මූල්‍ය ප්‍රකාශයන්හි ඉතා වැදගත් කොටසක් වන පිටු අංක 6 සිට 21 දක්වා පිටුවල දැක්වෙන ගිණුම්කරණ ප්‍රතිපත්ති හා මූල්‍ය ප්‍රකාශන සඳහා සිදු කරන ලද සටහන් හා එක්ව ඉහත සඳහන් විස්තීර්ණ ආදායම් ප්‍රකාශය කියවනු ලැබිය යුතුය.

**ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්**

2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

| | | 2014/12/31 | 2013/12/31 |
|---|---|---|---|
| | සටහන් | රු. ශත | රු. |
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපල, යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 06 | 423,481,344.54 | 439,453,144 |
| | | **423,481,344.54** | **439,453,144** |
| **ජංගම වත්කම්** | | | |
| භාණ්ඩ ලේඛන | 07 | 285,308,427.85 | 128,718,592 |
| වෙළඳ සහ වෙනත් ලැබීම් | 08 | 43,877,617.16 | 33,467,322 |
| ආයෝජන | 09 | 60,200,274.72 | 60,456,528 |
| මුදල් හා මුදල් සමානයන් | 10 | 7,461,285.79 | 3,907,650 |
| | | **396,847,605.52** | 226,550,092 |
| **මුළු වත්කම්** | | **820,328,950.06** | 666,003,235 |
| **සම කොටස් හා වගකීම්** | | | |
| **ප්‍රාග්ධන හා සංචිත** | | | |
| ප්‍රාග්ධන සංචිත | 12 | **136,873,127.45** | 152,382,927 |
| නැවත තක්සේරු කිරීමේ සංචිත | 13 | **307,170,027.56** | 307,170,028 |
| වියදම් ඉක්මවූ සමුච්චිත ආදායම | | **302,676,082.90** | 154,060,207 |
| **මුළු සම කොටස්** | | **746,719,237.91** | 613,613,162 |
| **ජංගම නොවන වගකීම්** | | | |
| විශ්‍රාම ප්‍රතිලාභ හිමිකම | 14 | **28,130,680.00** | 30,086,348 |
| වෛද්‍ය අරමුදල | 15 | **141,163.96** | 62,795 |
| | | **28,271,843.96** | 30,149,142 |
| **ජංගම වගකීම්** | | | |
| වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු | 16 | **45,337,868.19** | 22,240,932 |
| | | **45,337,868.19** | 22,240,932 |
| **මුළු මුදල් සමානයන් හා වගකීම්** | | **820,328,950.06** | 666,003,235 |

මෙම මූල්‍ය ප්‍රකාශයන්හි ඉතා වැදගත් කොටසක් වන පිටු අංක 6 සිට 20 දක්වා පිටුවල දැක්වෙන ගිණුම්කරණ ප්‍රතිපත්ති හා මූල්‍ය ප්‍රකාශන සඳහා සිදු කරන ලද සටහන් හා එක්ව ඉහත සඳහන් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය කියවනු ලැබිය යුතුය.

මෙම මූල්‍ය ප්‍රකාශන, 2007 අංක 07 දරන සමාගම් පනතේ දක්වා ඇති අවශ්‍යතාවලට අනුකූලව සකස් කරනු ලැබ ඇත.

.........................................................................

මුදල් ප්‍රධානි

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ හා ඉදිරිපත් කිරීමෙහි ලා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වගකීම දරනු ලැබේ.

**මණ්ඩලය සඳහා සහ වෙනුවෙන් අනුමත කර, අත්සන් තබන ලදී.**

........................................ ........................................

ජා-ඇල, කපුවත්ත — සභාපති — අධ්‍යක්ෂ

දිනය : 2016 මැයි 11 වන දින

ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්

2014 දෙසැම්බර් 31 දිනට අවසන් වර්ෂය සඳහා සම කොටස්හි වෙනස්කම් පිළිබඳ ප්‍රකාශනය

| | ප්‍රාග්ධන සංචිත | බහාලුම් සඳහා වන අරමුදල් | නැවත තක්සේරු කිරීමේ සංචිත | වියදම ඉක්මවූ සමුච්චිත ආදායම | එකතුව |
|---|---|---|---|---|---|
| | රු. ශත | රු. ශත | රු. ශත | රු. ශත | රු. ශත |
| 2013/01/01 දිනට ශේෂය | 147,354,856.01 | 4,296,065.15 | 307,170,027.56 | 173,818,495.73 | **632,639,444.45** |
| පූර්ව වර්ෂයේ ගැලපුම් | - | (4,296,065.15) | - | 90,147.17 | **(4,205,917.98)** |
| සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් ලද ප්‍රාග්ධන ලැබීම් | 27,425,002.45 | - | - | - | **27,425,002.45** |
| ක්ෂය වීම් - සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ලබා දෙන ලද ප්‍රාග්ධන වත්කම් ලැබීම් | (22,396,931.80) | - | - | - | **(22,396,931.80)** |
| 2013 වර්ෂයේ වියදම ඉක්මවූ ආදායම | - | - | - | (19,848,435.60) | **(19,848,435.60)** |
| | | | | | |
| 2013/12/31 දිනට ශේෂය | **152,382,926.66** | - | **307,170,027.56** | **154,060,207.30** | **613,613,161.52** |
| 2014/01/01 දිනට ශේෂය | 152,382,926.66 | - | 307,170,027.56 | 154,060,207.30 | **613,613,161.52** |
| සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් ලද ප්‍රාග්ධන ලැබීම් | 7,913,121.28 | - | - | - | **7,193,121.28** |
| ප්‍රාග්ධන සංචිතය වෙත මාරු කිරීම් | 462,000.00 | - | - | - | **462,000.00** |
| ක්ෂය වීම් - සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ලබා දෙන ලද ප්‍රාග්ධන වත්කම් ලැබීම් | (23,884,920.47) | - | - | - | **(23,884,920.47)** |
| පූර්ව වර්ෂයේ ගැලපුම් | - | - | - | 7,457.01 | **7,457.01** |
| 2014 වර්ෂයේ වියදම ඉක්මවූ ආදායම | - | - | | 148,196,491.09 | **148,196,491.09** |
| 2014 වර්ෂයේ වෙනත් විස්තීර්ණ ආදායම් | - | - | - | 411,927.50 | **411,927.50** |
| 2014/12/31 දිනට ශේෂය | **136,873,127.47** | - | **307,170,027.56** | **302,676,082.90** | **746,719,237.93** |

**ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්**

2014 දෙසැම්බර් 31 දිනට අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

| | 2014/12/31 | 2013/12/31 |
|---|---|---|
| | රු. | රු. |
| මෙහෙයුම් කටයුතුවලින් ලද මුදල් ප්‍රවාහ | | |
| වර්ෂය සඳහා වියදම ඉක්මවූ ආදායම | 148,608,419 | (19,848,436) |
| | | |
| ගැලපුම් | | |
| වර්ෂය සඳහා පාරිතෝෂිත ප්‍රතිපාදන | (411,928) | 3.6631,583 |
| වෛද්‍යාමය දායකත්වය සඳහා ප්‍රතිපාදන | 190,158 | 103,600 |
| | (221,770) | 3,765,183 |
| | | |
| කාරක ප්‍රාග්ධනයෙහි වෙනස්කම්වලට ප්‍රථම මෙහෙයුම් ලාභය | 148,386,649 | (16,083,253) |
| | | |
| කාරක ප්‍රාග්ධනයෙහි සිදු වූ වෙනස්කම් | | |
| ණයගැතියන්ගේ සහ වෙනත් ලැබිය යුතු දෑහි ඉහළ යාම/(පහළ යාම) | (10,146,585) | (5,669,989) |
| වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑහි ඉහළ යාම/(පහළ යාම) | 23,096,936 | 1,014,275 |
| භාණ්ඩ ලේඛනවල ඉහළ යාම/(පහළ යාම) | (156,589,836) | 26,589,005 |
| | (143,639,484) | 21,933,291 |
| | | |
| පාරිතෝෂිත ගෙවීමට ප්‍රථම මෙහෙයුම් කටයුතුවලින් ලද දළ මුදල් ප්‍රවාහ | 4,747,165 | 5,850,039 |
| අඩු කිරීම : ගෙවන ලද පාරිතෝෂික | (1,543,740) | (1,776,360) |
| වෛද්‍ය ප්‍රතිලාභ ගෙවීම් | (111,789) | (105,462) |
| බදු ගෙවීමෙන් පසු මෙහෙයුම් කටයුතුවලින් ලද දළ මුදල් ප්‍රවාහ | 3,091,636 | 3,968,217 |
| | | |
| ආයෝජන කටයුතුවලින් ලද මුදල් ප්‍රවාහ | | |
| දේපල, යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ අත්පත් කරගැනීම | (7,913,121) | (27,425,002) |
| භාණ්ඩාගාර බිල්පත් අත්පත් කරගැනීම | - | (60,456,528) |
| ආයෝජන කටයුතුවලින් ලද දළ මුදල් ප්‍රවාහ | (7,913,121) | (87,881,530) |
| | | |
| මූල්‍ය කටයුතුවලින් ලද මුදල් ප්‍රවාහ | | |
| සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් ලද ප්‍රාග්ධන ලැබීම් | 8,375,121 | 27,425,002 |
| මූල්‍ය කටයුතුවලින් ලද දළ මුදල් ප්‍රවාහ | 8,375,121 | 27,425,002 |
| | | |
| මුදල් සහ මුදල් සමානයන්ගේ වෙනස්වීම් | 3,553,636 | (60,694,229) |
| | | |
| මුදල් සහ මුදල් සමානයන් ඉදිරියට ගෙන එන ලදී | 3,907,650 | 64,601,879 |
| මුදල් සහ මුදල් සමානයන් ඉදිරියට ගෙන එන ලදී | 7,461,286 | 3,907,650 |
| මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයෙහි දක්වා ඇති මුදල් සහ මුදල් සමානයන්ගේ විශ්ලේෂණය | | |
| ලංකා බැංකුව, ජා-ඇල 71324617 | 7,461,286 | 3,633,719 |
| ලංකා බැංකුව, ජා-ඇල 72059803 | - | 273,931 |
| | 7,461,286 | 3,907,650 |

ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්
2014 දෙසැම්බර් 31 දිනට අවසන් වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

## 1. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

### 1.1.1 වාර්තා කිරීමේ ආයතනය

ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්, පූර්ණ රජය සතු සමාගමක් ලෙස ශ්‍රී ලංකාව තුල සංස්ථාපිත කර පිහිටුවා ඇති, සෞඛ්‍ය අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වන සීමිත වගකීමක් සහිත සමාගමකි. සමාගමේ ලියාපදිංචි කාර්යාලය සහ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය ශ්‍රී ලංකාව, ජා-ඇල, කපුවත්ත, තැ.පෙ. අංක 17 හි පිහිටා ඇත.

### 1.1.2 ප්‍රධාන කටයුතු සහ මෙහෙයුම්වල ස්වභාවය

සෞඛ්‍ය අමාත්‍යාංශයේ "ත්‍රිපෝෂ බෙදාහැරීමේ වැඩසටහන" සඳහා "ත්‍රිපෝෂ" නිෂ්පාදනය කරනු ලබන එකම සමාගම වනුයේ මෙම සමාගමයි.

සමාගමේ වෙනත් ප්‍රධාන කාර්යයන් වූයේ :

- ශ්‍රී ලංකාව තුල මාතෘ සහ ළමා මන්දපෝෂණය අඩු කිරීම සඳහා ශක්තිවර්ධක ශ්‍රී ලාංකික අතිරේක ආහාර නිෂ්පාදිතයක් වන "ත්‍රිපෝෂ" වැඩිදියුණු කිරීම, නිෂ්පාදනය සහ බෙදාහැරීම පිණිස පහසුකම් සැලසීම.
- ත්‍රිපෝෂ නිෂ්පාදනය සඳහා අමුද්‍රව්‍ය සපයනු ලබන දේශීය ගොවීන් වෙත හැකි තාක් දුරට ආදායම් ජනනය වන මාර්ග සඳහා ධෛර්යමත් කිරීම.
- රජයේ ප්‍රතිපත්තිය මත පදනම්ව, වෙනත් ආකාරයේ ශක්තිවර්ධක මිශ්‍ර කරන ලද ආහාර ද්‍රව්‍ය සඳහා පවතින වෙළඳපොල අවම කිරීම.
- වාර්ෂික ත්‍රිපෝෂ අවශ්‍යතාව පිළිබඳව ඇගයීමක් සිදු කර, එය සැපයීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.

### 1.1.3 අධ්‍යක්ෂ මණ්ඩලය

1. එම්. ඩී. බන්දුසේන මහතා (සභාපති)
2. වෛද්‍ය පාලිත ගුණරත්න මහීපාල
3. වෛද්‍ය ශාන්ති ගුණවර්ධන
4. එච්. එම්. තේජා හේරත් මහත්මිය
5. ජ්. ආර්. අහමඩ් මහත්මිය
6. වෛද්‍ය දමයන්ති හපුගොඩ
7. බී. පී. චින්තක කුලරත්න මහතා
8. එස්. ආර්. රාජපක්ෂ මහතා (නිරීක්ෂක)

**මණ්ඩලයේ ලේකම්**
තනූජා ප්‍රියදර්ශනී මහත්මිය

### 1.1.4 විගණකවරුන්

කපිල රත්නසිංහ සහ සමාගම
(වරලත් ගණකාධිකාරිවරුන්)
83/1/2, සුභද්‍රාරාම මාවත, ගංගොඩවිල, නුගේගොඩ

### 1.1.5 බැංකුකරුවන්

ලංකා බැංකුව

### 1.1.6 නිකුත් කිරීම සඳහා බලයලත් දිනය

අධ්‍යක්ෂ මණ්ඩලයේ 2016 මැයි 11 දිනැති යෝජනාවට අනුව, 2014 දෙසැම්බර් 31 දිනට අවසන් වර්ෂය සඳහා ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්හි මූල්‍ය ප්‍රකාශ නිකුත් කිරීම පිණිස අවසර ලබා දෙන ලදී.

**1.1.7 සකස් කිරීමේ පදනම**

**අ. අනුකූලතාව දැක්වීමේ ප්‍රකාශය**

ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සහ සටහන් ("මූල්‍ය ප්‍රකාශ") සමඟ ආදායම් ප්‍රකාශය, විස්තීර්ණ ආදායම් හා වියදම් ප්‍රකාශය, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, සම කොටස්හි වෙනස්කම් පිළිබඳ ප්‍රකාශය සහ මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය සකස් කරනු ලැබ ඇත්තේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරවරුන්ගේ සංගමය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව සහ 2007 අංක 7 දරන සමාගම් පනතෙහි දක්වා ඇති අවශ්‍යතාවලට අනුකූලවය.

**ආ. නිර්ණය කිරීමේ පදනම**

අදාල සටහන් යටතේ සාධාරණ වටිනාකම සම්බන්ධයෙන් යෝග්‍ය අනාවරණය කිරීම් සිදු කරනු ලබන අවස්ථාවන්හිදී හැර, මෙම මූල්‍ය ප්‍රකාශ ඓතිහාසික පිරිවැය පදනම මත සකස් කරනු ලැබ ඇත.

**ඇ. සංසන්දනාත්මක තොරතුරු**

වර්තමාන කාලසීමාව තුල මූල්‍ය ප්‍රකාශ පිළිබඳ අවබෝධය වැඩිදියුණු කිරීමේ සහ අන්තර් කාලසීමා තුලනාත්මකභාවය ඉහළ නැංවීමේ අරමුණින්, එම මූල්‍ය ප්‍රකාශවල වාර්තා කර ඇති පෙර වර්ෂයේ සියලුම වටිනාකම් සම්බන්ධයෙන් ගුණාත්මක, විස්තරාත්මක සහ ව්‍යක්ත තොරතුරු ඇතුලත් සංසන්දනාත්මක තොරතුරු අනාවරණය කරනු ලැබේ.

පහත දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති, වෙනත් යම් අයුරකින් දක්වා ඇති අවස්ථාවකදී හැරුණු කොට, මෙම මූල්‍ය ප්‍රකාශවල ඉදිරිපත් කර ඇති සියලුම කාලසීමාවන් සඳහා අඛණ්ඩව අදාල කරගනු ලැබ ඇත.

මෙම මූල්‍ය ප්‍රකාශවල අන්තර්ගත විෂයයන්හි ඉදිරිපත් කිරීම හෝ වර්ගීකරණය කිරීම සංශෝධනය කරනු ලැබ ඇති අවස්ථාවකදී, මනා ඉදිරිපත් කිරීමක් සිදු කිරීම පිණිස වත්මන් වර්ෂය හා අනුකූල වීම සඳහා සංසන්දනාත්මක වටිනාකම් ද නැවත වර්ගීකරණයට ලක් කරනු ලැබ ඇත.

**ඈ. ක්‍රියාකාරී සහ ඉදිරිපත් කිරීමේ වලංගු මුදල**

සමාගමේ ක්‍රියාකාරී සහ ඉදිරිපත් කිරීමේ වලංගු මුදල වන ශ්‍රී ලංකා රුපියල්වලින් මෙම මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කරනු ලැබේ.

වෙනත් යම් අයුරකින් දක්වා ඇති අවස්ථාවකදී හැරුණු කොට, ශ්‍රී ලංකා රුපියල්වලින් ඉදිරිපත් කර ඇති සියලුම මූල්‍ය තොරතුරු ආසන්න දහසට වටයනු ලැබ ඇත.

**ඉ. ප්‍රධාන ඇස්තමේන්තු සහ වැදගත් තීන්දු භාවිත කිරීම**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනුගත වූ මූල්‍ය ප්‍රකාශ සකස් කිරීම හා ඉදිරිපත් කිරීම මඟින් කළමනාකරණය විසින් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ වත්කම්, වගකීම්, ආදායම් සහ වියදම්හි වාර්තාගත වටිනාකම් කෙරෙහි බලපෑම් ඇති කරනු ලබන ස්වරූපයේ තීන්දු ගැනීම, ඇස්තමේන්තු සකස් කිරීම සහ පූර්ව නිගමනවලට එළඹීම අපේක්ෂා කෙරේ.

ඇස්තමේන්තු සහ පාදක කර ගත් පූර්ව නිගමන අඛණ්ඩ පදනමක් මත සමාලෝචනය කරනු ලැබේ. ඇස්තමේන්තුව සංශෝධනය කරනු ලබන කාලසීමාව තුල ගිණුම්කරණ ඇස්තමේන්තුවලට සිදු කරනු ලබන සංශෝධන හඳුනා ගනු ලබන්නේ, එම සංශෝධනය එම කාලසීමාව සඳහා පමණක් බලපාන්නේ නම් හෝ එකී සංශෝධනය වර්තමාන සහ අනාගත කාලසීමා දෙකටම බලපාන්නේ නම්, එම සංශෝධන කාලසීමාව සහ අනාගත කාලසීමාවන් තුලදී ය.

## 1.2 වත්කම් සහ එම වත්කම් තක්සේරු කිරීමේ පදනම්

### 1.2.1 දේපල, යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ

**අ. හඳුනාගැනීම සහ ඇගයීම**

දේපල, යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ විෂයයන් පිරිවැය යටතේ හෝ සමුච්චිත ක්ෂය වීම් අඩු කරන ලද සාධාරණ අගය යටතේ හෝ වෙනත් හායන යටතේ දක්වා ඇත.

සියලුම දේපල, යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ විෂයයන් මූලික වශයෙන් සමුච්චිත ක්ෂය වීම් අඩු කරන ලද පිරිවැය යටතේ හෝ වෙනත් හායන වාර්තා කර ඇත. වත්කමක වැදගත් අංග හඳුනා ගෙන, වෙන වෙනම ක්ෂය කිරීම සිදු කරනු ලැබේ. දේපල, යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණවල වැදගත් අංග අන්තර් කාලය තුල ආදේශ කරනු ලැබීමට අවශ්‍ය වන්නේ නම්, ආයතනය විසින් එම ආදේශ කළ කොටස බැහැර කරන අතර, නව කොටසෙහිම ප්‍රයෝජ්‍ය ජීව කාලය සහ ක්ෂය වීම් සමඟ එම කොටස හඳුනා ගනු ලැබේ. අනෙකුත් සියලුම අළුත්වැඩියා කිරීමේ හා නඩත්තු කිරීමේ පිරිවැය පැන නඟිනු ලබන පරිදි, ආදායම් ප්‍රකාශය තුල හඳුනා ගනු ලැබේ.

**ආ. පිරිවැය**

දේපල, යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණවල පිරිවැය, ඒවා මිලදී ගත් මිල සහ එයින් අපේක්ෂිත කාර්යය උදෙසා එම වත්කම ක්‍රියාකාරී තත්ත්වයට ගෙන ඒම පිණිස ඍජුවම දරන ලද වෙනත් පිරිවැයෙන් සමන්විත වේ.

ඉපැයීමේ ධාරිතාව පවත්වාගෙන යාමේ හෝ ඉහළ නැංවීමේ අරමුණින්, ස්ථිර ස්වරූපයේ වත්කම් අත්පත් කර ගැනීම, දීර්ඝ කිරීම හෝ වැඩිදියුණු කිරීම සඳහා දරනු ලබන පසුකාලීන වියදම්, ප්‍රාග්ධන වියදම් සේ සලකනු ලැබ ඇත.

ප්‍රධාන පරීක්ෂා කිරීම් සහ පරීක්ෂා කිරීමේ වියදම් ඇතුලත්, වෙන් වෙන් වශයෙන් ගිණුම්ගත කරනු ලබන දේපලක, යන්ත්‍රයක සහ යන්ත්‍රෝපකරණයක එක් අංගයක් ආදේශ කිරීම සඳහා දරනු ලබන වියදම, ප්‍රාග්ධනීකරණය කරනු ලැබේ. වෙනත් පසුකාලීන වියදම් ප්‍රාග්ධනීකරණය කරනු ලබන්නේ, එම අංගයේ ඇතුලත් ඉදිරි ප්‍රතිලාභ සමාගම වෙත ගලා ඒමේ හැකියාවක් පවතී නම් සහ එහි පිරිවැය යථාර්ථවාදී ලෙස අගයනු ලැබිය හැකි නම් පමණි.

**ඇ. ක්ෂය කිරීම්**

වත්කම්හි ඇස්තමේන්තුගත ප්‍රයෝජ්‍ය ජීව කාලය මත එම වත්කම්හි පිරිවැය ඉවත් කිරීම පිණිස, පහත සඳහන් වට්නාකම් යටතේ ඍජු රේඛීය පදනම (straight-line basis) මත වාර්ෂිකව, ප්‍රාග්ධන සංචිතය වෙත ක්ෂය කිරීම් සිදු කරනු ලැබේ.

| | |
|---|---|
| ගොඩනැගිලි | අවුරුදු 20ට වැඩි |
| යන්ත්‍රසූත්‍ර සහ යන්ත්‍රෝපකරණ | අවුරුදු 20ට වැඩි |
| මෝටර් රථ | අවුරුදු 05ට වැඩි |
| යන්ත්‍රෝපකරණ හා උපකරණ | අවුරුදු 05ට වැඩි |
| විද්‍යාගාර උපකරණ | අවුරුදු 05ට වැඩි |
| කෘෂිකාර්මික උපකරණ | අවුරුදු 10ට වැඩි |
| විදුලි වැඩ | අවුරුදු 05ට වැඩි |
| කාර්යාල උපකරණ | අවුරුදු 10ට වැඩි |
| ලී බඩු සහ සවි කිරීම් | අවුරුදු 10ට වැඩි |

ඈ. බැහැර කිරීම

බැහැර කරන විටදී හෝ භාවිතයෙන් කිසිදු ඉදිරි ආර්ථික ප්‍රතිලාභයක් අපේක්ෂා නොකරනු ලබන අවස්ථාවකදී, දේපලක, යන්ත්‍රයක සහ යන්ත්‍රෝපකරණයක අංගයක් බැහැර කරනු ලැබූ සේ සැලකේ. වත්කම් බැහැර කිරීම මත හිමි වන ඕනෑම ලාභයක් හෝ පාඩුවක්, එම බැහැර කිරීම සිදු කරනු ලබන වර්ෂයේ විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුල ඇතුලත් කරනු ලැබේ.

**1.2.2 නිම නොවූ වැඩ**

භාවිතයේ පවතින ප්‍රාග්ධනය පිරිවැයෙහි දක්වනු ලැබේ. මෙම වියදම්, ප්‍රාග්ධනීකරණය වීමට ඇති ගොඩනැඟිලි ඉදි කිරීමේදී ඍජුවම හට ගන්නා ප්‍රාග්ධන ස්වරූපයක වියදම් වේ. භාවිතයේ පවතින ප්‍රාග්ධනය, භාවිතය සඳහා ලබා ගත හැකි අවස්ථාවේදී, අදාල දේපල, යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ වත්කම් වර්ගීකරණයට මාරු කරනු ලැබේ ; එනම්, සමාගම විසින් අපේක්ෂිත අයුරින් ඒ සඳහා ක්‍රියාත්මක වීමට හැකි ආකාරයෙන් එය පිහිටා ඇති අවස්ථාවේදී සහ අවශ්‍ය තත්ත්වයෙන් පවතින අවස්ථවේදී ය. භාවිතයේ පවතින ප්‍රාග්ධනය, ණය ලබා ගැනීමේ පිරිවැය, යම් සමුච්චිත හායන අඩුවීම් ඇතුලත් පිරිවැය තුල දක්වනු ලැබේ.

**1.2.3 අස්පෘශ්‍ය වත්කම්**

වත්කම වෙත ලැබෙන ඉදිරි ආර්ථික ප්‍රතිලාභ ආයතනය වෙත ගලා ඒමේ සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 38-අස්පෘශ්‍ය වත්කම්හි පරිදි වත්කමෙහි පිරිවැය යථාර්ථවාදී ලෙස ඇගයීමේ හැකියාවක් පවතී නම්, එය අස්පෘශ්‍ය වත්කමක් ලෙස හඳුනා ගනු ලැබේ. ඒ අනුව, මෙම වත්කම්, මූල්‍ය ප්‍රකාශනයේ සමුච්චිත ක්‍රමක්ෂය සහ වෙනත් සමුච්චිත හායන අඩු කරන ලද පිරිවැය යටතේ සඳහන් කරනු ලැබේ.

පරිගණක මෘදුකාංග වර්ෂ 5ක කාලසීමාවක් පුරා ඍජු රේඛීය ක්‍රමය මත ක්‍රමක්ෂය කර ඇත.

වර්ෂ 5ක කාලසීමාවක් පුරා ඍජු රේඛීය ක්‍රමය මත අධ්‍යයන පරිපාටි සංවර්ධනය කිරීමේ පිරිවැය බැහැර කර තිබේ.

**1.2.4 භාණ්ඩ ලේඛන**

කල් ඉකුත් වූ සහ අඩු ක්‍රියාකාරී අයිතම සඳහා නිසි දීමනා ලබා දීමෙන් අනතුරුව, සාමාන්‍ය පිරිවැය යටතේ භාණ්ඩ ලේඛන ඇගයීම සිදු කරනු ලැබේ. ලබා ගත හැකි දළ වටිනාකම වනුයේ, සාමාන්‍ය වෙළෙඳපොල තුල, භාණ්ඩ ලේඛනය සකස් කිරීම අවසන් වූ පසු ඇස්තමේන්තුගත පිරිවැයට අඩු සහ විකිණීම සඳහා ඇස්තමේන්තුගත පිරිවැය යටතේ වන මිලයි.

භාණ්ඩ ලේඛන වත්මන් ස්ථානයට සහ තත්ත්වයට රැගෙන ඒමේදී දරනු ලබන පිරිවැය, පහත සඳහන් සූත්‍ර භාවිත කරමින් ගිණුම්ගත කරනු ලැබේ : -

| | |
|---|---|
| අමුද්‍රව්‍ය | - පිරිවැය යටතේ |
| නිමකළ භාණ්ඩ සහ නිම නොවූ වැඩ | - ඍජු ද්‍රව්‍ය සහ ඍජු ශ්‍රම පිරිවැය යටතේ සාමාන්‍ය මෙහෙයුම් ධාරිතාව මත පදනම්ව ස්ථිර නිෂ්පාදිතයේ යෝග්‍ය සමානුපාතිකයක් සඳහා වියදම් වෙන් කිරීම් සිදු කරනු ලබයි. |
| ගෙන යාමට නියමිත භාණ්ඩ | - සත්‍ය පිරිවැය යටතේ |

ලබා ගත හැකි දළ වටිනාකම වනුයේ, සාමාන්‍ය වෙළෙඳපොල තුල, භාණ්ඩ ලේඛනය සකස් කිරීම අවසන් වූ පසු ඇස්තමේන්තුගත පිරිවැයට අඩු සහ විකිණීම සඳහා ඇස්තමේන්තුගත පිරිවැය යටතේ වන ඇස්තමේන්තුලගත විකුණුම් මිලයි.

**1.2.5 වත්කම් හායනය**

හායනය පිළිබඳ යම් සඳහනක් වේ දැයි නිර්ණය කිරීම සඳහා සෑම වාර්තා කරනු ලබන දිනකදීම වත්කම්හි ප්‍රවාහන පිරිවැය සමාලෝචනය කරනු ලැබේ. එවැනි සඳහනක් වුවහොත්, නැවත ලබා ගත හැකි වත්කම් ප්‍රමාණය ඇස්තමේන්තු කරනු ලැබේ. හායන පාඩුවක් හඳුනා ගනු ලබන්නේ, යම් වත්කමක ප්‍රවාහන පිරිවැය හෝ මුදල් ජනනය කිරීමේ ඒකකය, එහි නැවත ලබා ගත හැකි ප්‍රමාණය ඉක්මවා යන්නේ නම්ය. නැවත ලබා ගත හැකි ප්‍රමාණය නිර්ණය කිරීම සඳහා භාවිත කරන ලද ඇස්තමේන්තුවල වෙනසක් සිදු වී ඇත්නම්, හායන පාඩුව නැවත හරවාලනු ලැබේ.

### 1.2.6 මූල්‍ය වත්කම්

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 39 යටතේ පවත්නා මූල්‍ය වත්කම්, ලාභ හෝ අලාභ, ණය සහ ලැබිය යුතු, කල් පිරීමට නියමිත ආයෝජන, විකිණීමට ඇති මූල්‍ය වත්කම් හරහා සාධාරණ අගයක් යටතේ වන මූල්‍ය වත්කම් ලෙස හෝ යෝග්‍ය පරිදි, ඵලදායී සීමාවක් තුල සීමා කිරීමේ උපකරණ ලෙස සලකනු ලබන ව්‍යුත්පන්න ලෙස හෝ වර්ගීකරණය කරනු ලැබේ. සමාගම විසින් පළමු අවස්ථාවේදීම, සිය මූල්‍ය වත්කම් වර්ගීකරණය පිළිබඳව නිර්ණය කරනු ලබයි. සියලුම මූල්‍ය වත්කම් මූලිකවම සාධාරණ වටිනාකම් අතිරික්තය යටතේ හඳුනාගනු ලබන්නේ, ගණුදෙණු පිරිවැය සඳහා සෘජුවම බලපෑම් කරනු ලබන, ලාභ හෝ අලාභ හරහා සාධාරණ අගයක් යටතේ වත්කම් නොවනු ලබන අවස්ථාවකදී ය.

සමාගම විසින්, ඔවුන් සිය සමාගම ස්ථාපිත කළ දිනයේ සිට ණය, ලැබිය යුතු සහ තැන්පතු හඳුනාගනු ලැබේ. අනෙකුත් සියලුම මූල්‍ය වත්කම් (ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකමක් යටතේ දක්වා ඇති වත්කම් ඇතුලත්ව) මූලිකව හඳුනාගනු ලබන්නේ, වෙළඳ ගිවිසුමෙහි ගිවිසුම්ගත විධිවිධාන සඳහා සමාගම විසින් පාර්ශ්වකරුවකු වනු ලබන වෙළඳ දිනයේදී ය.

වත්කමකින් ලැබෙන මුදල් ප්‍රවාහ සඳහා ගිවිසුම්ගත අයිතීන් කල් ඉකුත් වූ විට, සමාගම විසින් එම මූල්‍ය වත්කම බැහැර කරනු ලබන අතර, එමගින් මූල්‍ය වත්කම් මත ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ ලබා ගැනීම උදෙසා, සාරානුකූලව මූල්‍ය වත්කමෙහි සියලුම අවදානම් සහ ප්‍රතිලාභ පවරා දෙනු ලබන ගණුදෙණුවක් හරහා එම අයිතිය මාරු කරනු ලැබේ. සමාගම විසින් ඇති කරනු ලබන හෝ රඳවා තබා ගනු ලබන, පවරන ලද මූල්‍ය වත්කම්හි ඕනෑම පොලියක්, වෙන් වෙන් වශයෙන් වත්කමක් හෝ වගකීමක් සේ හඳුනාගනු ලැබේ.

මූල්‍ය වත්කම් සහ වගකීම් කපා හැරීමක් වන අතර, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය තුල එම දළ අගය ඉදිරිපත් කරනු ලබන්නේ, එම අගයන් කපා හැරීමට සමාගම සතුව නෛතික අයිතියක් පවතින විට සහ දළ පදනමක් මත නිරවුල් කිරීමට හෝ වත්කම අත්පත් කොට ගෙන, ඒ හා සමගාමීව වගකීම නිරවුල් කිරීමට අපේක්ෂා කරන්නේ නම් පමණකි.

සමාගමේ මූල්‍ය වත්කම් තුල මුදල්, කෙටිකාලීන ආයෝජන, වෙළඳ සහ වෙනත් ලැබිය යුතු දෑ ඇතුලත් වේ.

අ. ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකමක් යටතේ පවතින මූල්‍ය වත්කම්

ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකමක් යටතේ පවතින මූල්‍ය වත්කම් තුල වෙළඳාම සඳහා දරන ලද මූල්‍ය වත්කම් සහ ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකමක් යටතේ මූලික හඳුනාගැනීම මත වර්ගීකරණයට ලක් කරන ලද මූල්‍ය වත්කම් ඇතුලත් වේ. මූල්‍ය වත්කම් වෙළඳාම සඳහා දරන ලද්දේ යයි වර්ගීකරණය කරනු ලබන්නේ, ආසන්නතම කාලසීමාව තුලදී විකිණීමේ හෝ නැවත මිලදී ගැනීමේ අරමුණින්, එම වත්කම් අත්පත් කරගනු ලබන්නේ නම්ය.

ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකමක් යටතේ මූල්‍ය වත්කම්, විස්තීර්ණ ආදායම් ප්‍රකාශයෙහි මූල්‍ය ආදායම හෝ මූල්‍ය වියදම තුල හඳුනාගනු ලබන සාධාරණ වටිනාකමෙහි වෙනස්කම් සමඟ සාධාරණ වටිනාකම යටතේ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය තුල දක්වාලනු ලැබේ.

සමාගම විසින් ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකමක් යටතේ මූලික හඳුනාගැනීම මත කිසිදු මූල්‍ය වත්කමක් වර්ගීකරණය කර නොමැත.

ආ. ණය සහ ලැබිය යුතු

ණය සහ ලැබිය යුතු යනු, ක්‍රියාකාරී වෙළඳපොලක් තුල මතු කොට දක්වා නොමැති, ස්ථිර හෝ ලැබේ යයි සැලකිය හැකි ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් වේ. මූලික ඇගයීමෙන් අනතුරුව, හායන අඩු කර ඵලදායී පොලී අනුපාත (EIR) ක්‍රමවේදය භාවිත කරමින්, එවැනි මූල්‍ය වත්කම් ක්‍රමක්ෂය පිරිවැය යටතේ පසුව අගයනු ලැබේ. ක්‍රමක්ෂය පිරිවැය ගණනය කරනු ලබන්නේ, අත්පත් කරගැනීම මත ලද වට්ටම් හෝ වාරික සහ ඵලදායී පොලී අනුපාතයෙහි වැදගත් කොටසක් වන ගාස්තු හෝ පිරිවැය සැලකිල්ලට ගැනීමෙනි. හායනය හේතුවෙන් පැන නගින අලාභ, මූල්‍ය පිරිවැයෙහි සඳහන් විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුල හඳුනාගනු ලැබේ.

ලැබිය යුතු වෙළඳ ආදායම්, සේවක ණය, තැන්පතු, අත්තිකාරම්, වෙනත් ලැබිය යුතු සහ මුදල් සහ මුදල් සමානයන් ආදියෙන් ණය සහ ලැබිය යුතු ආදායම් සමන්විත වේ.

ඇ. කල් පිරීමට නියමිත ආයෝජන

ස්ථිර හෝ නිර්ණය කළ හැකි ගෙවීම් සහ ස්ථිර කල් පිරෙන තැන්පතු හා බැඳි ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම්, සමාගම විසින් ධනාත්මක අදහසකින් පසු වන සහ කල් පිරෙන තෙක් ඒවා රඳවා තබා ගැනීමේ හැකියාව සමාගම සතු වූ විට, කල් පිරීමට නියමිත ආයෝජන ලෙස වර්ගීකරණය කරනු ලැබේ. මූලික ඇගයීමෙන් අනතුරුව, හායන අඩු කර ඵලදායී පොලී අනුපාත (EIR) ක්‍රමවේදය භාවිත කරමින්, එවැනි කල් පිරීමට නියමිත ආයෝජන ක්‍රමක්ෂය පිරිවැය යටතේ පසුව අගයනු ලැබේ. ඵලදායී පොලී අනුපාත ක්‍රමක්ෂය විස්තීර්ණ ආදායම් ප්‍රකාශයෙහි සඳහන් මූල්‍ය ආදායම තුල හඳුනාගනු ලැබේ. රජයේ සුරැකුම්පත් සහ ස්ථිර තැන්පතුවල කරනු ලබන ආයෝජන, කල් පිරීමට නියමිත ආයෝජන යටතේ වර්ගීකරණය කරනු ලැබ ඇත.

ඇ. විකිණීමට හැකි මූල්‍ය ආයෝජන

විකිණීමට හැකි ලෙස හෝ ඉහත සඳහන් මූල්‍ය වත්කම් වර්ගීකරණ කිසිවක් තුල වර්ගීකරණය කර නොමැති ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම්, විකිණීමට හැකි මූල්‍ය වත්කම් වේ. මූලික හඳුනාගැනීමෙන් අනතුරුව, එම වත්කම් සාධාරණ වටිනාකම අනුව අගයනු ලබන අතර, හායන හැර වෙනස්කම් වෙනත් විස්තීර්ණ ආදායම් තුල හඳුනාගනු ලබන අතර, අරමුදල් සහ සංචිතවල තැන්පත් කර ඇති සාධාරණ වටිනාකමින් ඉදිරිපත් කරනු ලැබේ. විකිණීමට හැකි ණය සුරැකුම් මත පොලී ආදායම ඵලදායී පොලී අනුපාත ක්‍රමවේදය භාවිත කරමින් ගණනය කරනු ලබන අතර, ලාභ හෝ අලාභ තුල හඳුනාගනු ලැබේ. යම් ආයෝජනයක් බැහැර කරනු ලැබූ විට, අරමුදල් හෝ සංචිත තුල සමුච්චිත ලැබීම් හෝ පාඩු, ලාභ හෝ අලාභ ගිණුමෙහි නැවත වර්ගීකරණය කරනු ලැබේ.

මූලික හඳුනාගැනීම මත, සමාගම විසින් කිසිදු මූල්‍ය වත්කමක් විකිණීමට හැකි ආයෝජනයක් ලෙස බැහැර කරනු නොලැබේ.

1.2.7.1 මූල්‍ය වත්කම් හායනය

සමාගම විසින් සෑම වාර්තා කරනු ලබන දිනකදීම, මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් සමූහයක් හායනය වී ඇති බවට හරයාත්මක සාක්ෂි පවතීදැයි අගයනු ලබන අතර, එවැනි හායනයක් සිදු වී ඇත්නම්, එම හායනය වී ඇති ප්‍රමාණය ගණනය කරනු ලබන්නේ, වත්කම් දැරීමේ වටිනාකම සහ ඇස්තමේන්තුගත ඉදිරි මුදල් ප්‍රවාහයේ වත්මන් වටිනාකම අතර වෙනස ලබා ගනිමිනි.

1.2.8 මුදල් හා මුදල් සමානයන්

අතැති මුදල්, බැංකු තැන්පතු සහ නැවත මිලදී ගැනීමේ ගිවිසුම් යනාදියෙන් මුදල් සහ මුදල් සමානයන් සමන්විත වේ.

"සෘජු නොවන ක්‍රමවේදය" භාවිත කරමින් සකස් කරනු ලැබ ඇති මුදල් ප්‍රවාහ ප්‍රකාශය සඳහා මුදල් සහ මුදල් සමානයන්ගේ අංගයක් ලෙස බැංකු අයිරාව ඇතුලත් කරනු ලැබේ.

1.3 වගකීම් සහ ප්‍රතිපාදන

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි ජංගම වත්කම් ලෙස වර්ගීකරණය කරනු ලබන වගකීම් වනුයේ, ඉල්ලීම මත හෝ වාර්තා කරනු ලබන දින සිට එක් වර්ෂයක් තුල ගෙවීම සඳහා හිඟ ලෙස පවතිනු ලබන ශේෂයන් ය. වාර්තා කරනු ලබන දින සිට එක් වර්ෂයකට පසු ගෙවීම සඳහා හිඟ ලෙස පවතිනු ලබන ශේෂයන් ජංගම නොවන වත්කම් වේ.

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, දත් සියලුම වගකීම් සලකා බලනු ලැබේ. අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස නෛතික හෝ සාධනීය වගකීමක් සමාගම සතුවන අවස්ථාවේදී, ප්‍රතිපාදන සහ වගකීම් හඳුනා ගනු ලබන අතර, මෙම වගකීම පියවීම සඳහා ආර්ථික ප්‍රතිලාභ පිටතට ගලා යාමක් අවශ්‍ය වනු ඇත.

### 1.3.1 සේවක ප්‍රතිලාභ

**අ. විශ්‍රාම පාරිතෝෂිත සඳහා ප්‍රතිපාදන**

1983 අංක 12 දරන පාරිතෝෂිත ගෙවීමේ පනත යටතේ, සියලුම සුදුසුකම් ලත් සේවකයින් උදෙසා සමාගම විසින් ප්‍රතිලාභ සැලැස්මක් අදාළ කරගනු ලැබ ඇත. මෙම ප්‍රතිලාභ සැලැස්ම සඳහා බාහිර වශයෙන් අරමුදල් සපයනු නොලැබේ.

මෙම ප්‍රතිපාදන ගණනය කිරීමේදී භාවිත කරනු ලබන මූලික පූර්ව නිගමන තුල පහත දැක්වෙන කරුණු ඇතුලත් වේ :

| | |
|---|---|
| වට්ටම් අනුපාතය | 12% |
| ඉදිරි වැටුප් වැඩිවීම් අනුපාතය | 10% |
| කාර්යමණ්ඩල පිරිවැටුම | 02% |
| විශ්‍රාම ගැනීමේ වයස | අවුරුදු 55 |

සමාගම විසින් මෙය අඛණ්ඩව පවත්වාගෙන යනු ඇත.

**ආ. අර්ථ නිරූපිත දායකත්ව සැලැස්ම**

අර්ථ නිරූපිත දායකත්ව සැලැස්ම පශ්චාත් සේවා නියුක්ති සැලැස්මක් වන අතර, ඒ යටතේ ආයතනයක් විසින් වෙනත් යම් ආයතනයක් වෙත ස්ථිර දායකත්වයක් ගෙවනු ලබන අතර, අමතර වට්නාකමක් ගෙවීම සඳහා ඊට කිසිදු නෛතික හෝ සාධනීය වගකීමක් හිමි නොවනු ඇත. අර්ථ නිරූපිත දායකත්ව සඳහා වගකීම් වෙනුවෙන් වන දායකත්ව, විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුල හිඟ ලෙස පෙන්නුම් කෙරෙන පරිදි සහ අවස්ථාවන්හිදී එම ප්‍රකාශයෙහි වියදමක් ලෙස හඳුනාගනු ලැබේ.

**ඇ. සේවක අර්ථසාධක අරමුදල**

එක් එක් සේවකයකුගේ වැටුප මත සමාගම සහ සේවකයා විසින් පිළිවෙලින්, 12% හා 8% බැගින් වන පරිදි, අනුමත කරන ලද අර්ථසාධක අරමුදල වෙත සිය දායකත්වය සපයනු ලැබේ.

**ඇ. සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල**

ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ් විසින් එක් එක් සේවකයකුගේ වැටුප මත 3% ක් මඟින් සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල වෙත සිය දායකත්වය සපයනු ලැබේ.

### 1.3.2 වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු

වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ පිරිවැයෙහි සඳහන් කරනු ලැබේ.

### 1.3.3 බදුකරණය

ලාභාංශ හෝ පොලීවලින් ලද අතිරික්තය සහ ආදායම් හැර, සමාගමේ අතිරික්තය සහ ආදායම්, 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතෙහි 7 (ixiv) වගන්තිය යටතේ ආදායම් බදුවලින් නිදහස් කෙරේ.

### 1.3.4 කල් තබන ලද බදුකරණය

සමාගමේ අතිරික්තය සහ ආදායම, 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතෙහි 7 (ixiv) වගන්තිය යටතේ ආදායම් බදුවලින් නිදහස් කර ඇති හෙයින්, කල් තබන ලද බදු සඳහා විධිවිධාන සකස් කර නොමැත.

**1.3.5 ප්‍රාග්ධන වගකීම් හා අවිනිශ්චිත වගකීම්**

අවිනිශ්චිත වගකීම් යනු, ආර්ථික ප්‍රතිලාභ පැවරීම සිදු කළ නොහැකි හෝ නිසියාකාරව ගණනය කළ නොහැකි අවිනිශ්චිත අනාගත සිදුවීම් හෝ වර්තමාන වගකීම්වලින් පමණක් පැවැත්ම සහතික කරනු ලැබිය හැකි වගකීම් ය.

මූල්‍ය ප්‍රකාශනවලට සිදු කරන අදාල සටහන්හි සමාගමේ ප්‍රාග්ධන වගකීම් සහ අවිනිශ්චිත වගකීම් අනාවරණය කරනු ලැබේ.

**1.4 විස්තීර්ණ ආදායම් ප්‍රකාශය**

**ප්‍රාග්ධන සංචිතය - (ප්‍රාග්ධන ප්‍රදානවලට අදාලව)**

වර්ෂ 2000 සිට සෞඛ්‍ය අමාත්‍යාංශය, කෙයා (CARE) ආයතනය සහ ශ්‍රී ලංකා දුම්කොළ සමාගම විසින් ස්ථිර වත්කම් මත වැය කරන ලද අරමුදල්, ප්‍රාග්ධන ප්‍රදාන ලෙස සලකනු ලැබ ඇති අතර, ඒ අනුව, වර්ෂය සඳහා සමස්ත ක්ෂය කිරීම් සඳහා හිලව් කිරීම සිදු කරමින්, මෙම විෂයන්ට අදාල ක්ෂය කිරීම් අදාල ප්‍රාග්ධන ප්‍රදාන ගිණුම්වලට ඇතුලත් කරනු ලැබ ඇත.

**1.4.1 ප්‍රදාන**

යම් ප්‍රදානයක් ලැබෙන බවට සහ ඊට යා කොට ඇති කොන්දේසි හා අනුගත වනු ඇති බවට සාධාරණ සහතිකවීමක් පවතින අවස්ථාවකදී රජයේ ප්‍රදාන හඳුනාගනු ලැබේ.
සමාගම තුල ඇති කෙරෙනු ලබන වියදම් වෙනුවෙන් ඒ වෙත පිරිනමනු ලබන ප්‍රදාන, එම වියදම් හඳුනාගනු ලබන වර්ෂයේම විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුල ආදායම් ලෙස හඳුනාගනු ලැබේ. යම් වත්කමක පිරිවැය සඳහා සමාගම වෙත ලබා දෙනු ලබන ප්‍රදාන, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය තුල හඳුනාගනු ලැබේ.

**1.4.3 වියදම්**

අ. ජනනය වූ පිරිවැය සහ සුවිශේෂී ආදායම් වර්ග ඉපැයීම් අතර සෘජු සබඳතාව මත පදනම්ව, විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුල වියදම් හඳුනාගනු ලැබේ. සමාගමෙහි මෙහෙයුම් කටයුතුවලදී සහ කාර්යක්ෂම අවස්ථාවන්හිදී ප්‍රාග්ධන වත්කම් නඩත්තු කිරීමේදී ඇති වන සියලුම වියදම්, එම වර්ෂය සඳහා අතිරික්තය ගණනය කිරීමේදී ආදායම්හි ප්‍රතිපාර්ශ්විය ලෙස අය කරගනු ලැබ ඇත.

**1.4.4 මූල්‍ය වියදම්/ආදායම්**

ආයෝජනය කරන ලද අරමුදල් සඳහා උපචිත පදනම මත ලද පොලියෙන් මූල්‍ය ආදායම සමන්විත වේ.

**1.5 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය**

මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රතිපත්ති 7 හා අනුගතව සකස් කරනු ලැබ ඇත.

ගෙවන ලද පොලී, මෙහෙයුම් මූල්‍ය ප්‍රවාහ යටතේ වර්ගීකරණය කරනු ලබන අතර, ලද පොලිය, ආයෝජන මූල්‍ය ප්‍රවාහ යටතේ වර්ගීකරණය කරනු ලැබේ.

**1.6 වාර්තාකිරීමේ කාලසීමාව අවසානයේ සිදුවීම්**

වාර්තාකිරීමේ කාලසීමාව අවසානයේ හට ගනු ලබන සිදුවීම්වල වාස්තවික බව සලකා බලනු ලැබ ඇති අතර, අවශ්‍ය අවස්ථාවන්හිදී ගිණුම් තුල යෝග්‍ය ගැලපුම් සිදු කරනු ලැබ ඇත.

## 1.7 නිකුත් කරන ලද, එහෙත් තවමත් ක්‍රියාත්මකභාවයේ නොමැති ප්‍රමිතීන්

සමාගමෙහි වාර්ෂික මූල්‍ය ප්‍රකාශ නිකුත් කළ දින දක්වා නිකුත් කරන ලද, එහෙත් තවමත් ක්‍රියාත්මකභාවයේ නොමැති ප්‍රමිතීන් පහත දැක්වේ. නිකුත් කරන ලද ප්‍රමිතීන් සහ අර්ථනිරූපණ ලේඛනය යනු, ඉදිරි දිනකදී අදාල කරගනු ලබන අවස්ථාවකදී අනාවරණය කිරීම්, මූල්‍ය තත්ත්වය හෝ කාර්යසාධනය මත බලපෑමක් ඇති කෙරෙනු ඇති බවට සමාගම විසින් සාධාරණිතව අපේක්ෂා කරනු ලබන ප්‍රමිතීන් සහ අර්ථනිරූපණ වේ. මෙම ප්‍රමිතීන් බලාත්මක වනු ලබන අවස්ථාවේදී, එම ප්‍රමිතීන් අදාල කරගනු ලැබීමට සමාගම විසින් අපේක්ෂා කරනු ලබයි.

අ. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 9 - මූල්‍ය උපකරණ :

වර්ගීකරණය සහ ගණනය කිරීමේ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 9 මඟින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 39 ආදේශ වනු ලබන අතර, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 39හි අර්ථනිරූපිත මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් වර්ගීකරණය සහ ගණනය කිරීම සඳහා අදාල කරගනු ලැබේ. මෙම ප්‍රමිතියෙහි අනිවාර්ය බලාත්මක දිනය කල් තබා ඇත. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 9හි පළමු අදියර අදාල කරගැනීම මඟින් සමාගමෙහි මූල්‍ය වත්කම්වල වර්ගීකරණය සහ ගණනය කිරීම මත බලපෑමක් ඇති කරනු ලබන නමුත්, වාස්තවිකව මූල්‍ය වගකීම් වර්ගීකරණය සහ ගණනය කිරීම මත කිසිදු බලපෑමක් ඇති නොකරනු ලැබේ. විස්තරාත්මක ඉදිරිපත් කිරීමක් ඉදිරිපත් කිරීම පිණිස, නිකුත් කරනු ලැබූ විට, සමාගම විසින් අනෙකුත් අදියරයන් හා එක්ව ගෙන එහි බලපෑම ගණනය කරනු ලැබේ.

## 1.8 විකිණීම සඳහා තබාගන්නා ලද ජංගම නොවන වත්කම්

නිරන්තර භාවිතය හරහා නොව මූලිකව, බැහැර කිරීම මඟින් නැවත ලබාගැනීමට අපේක්ෂිත ජංගම නොවන වත්කම්, විකිණීම සඳහා තබාගන්නා ලද වත්කම් ලෙස වර්ගීකරණය කරනු ලැබේ. විකිණීම සඳහා තබාගන්නා ලද වත්කම් ලෙස වර්ගීකරණය කිරීමට වහාම ප්‍රථම, සමාගමෙහි ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනුගතව මෙම වත්කම් නැවත ගණනය කරනු ලැබේ. ඉන් පසුව, එම වත්කම්හි වටිනාකමට අඩු වටිනාකම සහ විකුණුම් පිරිවැය අඩු කරන ලද සාධාරණ වටිනාකම යටතේ එම වත්කම් ගණනය කරනු ලැබේ. විකුණුම් සඳහා තබාගන්නා ලද, මූලික වර්ගීකරණය කිරීම මත හායන පාඩු සහ නැවත ගණනය කිරීම මත ලද පසුකාලීන ලැබීම් හෝ පාඩු, ලාභ හෝ අලාභ තුල හඳුනාගනු ලැබේ. කිනම් හෝ සමුච්චිත හායන පාඩුවක් ඉක්මවා ලැබීම් හඳුනාගනු නොලැබේ.

ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්
2014 දෙසැම්බර් 31 දිනට අවසන් වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

| | 2014 | 2013 |
|---|---|---|
| 02. වර්ෂය තුල ප්‍රතිපූර්ණ වියදම් | රු. ශත | රු. |
| සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් ලද වියදම් ප්‍රතිපූර්ණය කිරීම | **1,776,560,231.70** | 1,376,678,445 |
| ලෝක ආහාර වැඩසටහනට ත්‍රිපෝෂ ලබාදීමෙන් ලැබූ ආදායම | - | 4,529,970 |
| | **1,776,560,231.70** | 1,381,208,415 |
| 03. නිෂ්පාදන පිරිවැය | | |
| අමුද්‍රව්‍ය භාවිතය | **1,558,995,388.01** | 1,190,839,956 |
| සෘජු ශ්‍රමය | **109,605,729.30** | 101,811,367 |
| කර්මාන්තශාලාවේ වියදම් සඳහා වෙන් කරන ලද මුදල | **89,129,409.50** | 85,610,450 |
| ප්‍රාථමික පිරිවැය | **1,757,730,526.81** | 1,378,261,773 |
| එකතු කළා : වර්ෂය මුල නිම කරන ලද නිෂ්පාදිත | **16,192,484.30** | 20,730,175 |
| වර්ෂය මුල සුළු නිෂ්පාදිත | **86,007.73** | 101,939 |
| අඩු කළා : වර්ෂය අවසානයේ නිම කරන ලද නිෂ්පාදිත | **(25,956,190.88)** | (16,192,484) |
| වර්ෂය අවසානයේ සුළු නිෂ්පාදිත | - | (86,008) |
| නැවත සකස් කිරීමේ පිරිවැය | - | (544,244) |
| | **1,748,052,827.97** | 1,382,271,151 |
| | | |
| 04. වෙනත් ආදායම් | | |
| අපතය විකුණුම් | **11,651,848.70** | 10,175,630 |
| වෙනත් ආදායම් | **145,610.33** | 2,337,678 |
| භාණ්ඩාගාර බිල්පත් මත පොලී ආදායම් | **5,443,746.72** | 6,787,847 |
| ගෝනි විකුණුම් | **2,068,769.50** | 3,955,398 |
| විවිධ සුළු ආදායම් | **308,837.10** | 291,917 |
| නිවාස ණය පොලිය | **1,469,059.28** | 814,674 |
| කිරාන් අතපත්තු මහතාගෙන් ලද පරිත්‍යාග | **145,610.33** | 259,00 |
| | **21,233,481.96** | 24,622,143 |
| 05. වර්ෂය සඳහා වියදම ඉක්මවූ ආදායම | | |
| වර්ෂය සඳහා වියදම ඉක්මවූ ආදායම ගණනය කිරීමේදී පහත සඳහන් විෂයයන් සඳහා අයකිරීම් සිදු කරනු ලැබ ඇත. | **2014** රු. ශත | 2013 රු. |
| මූලික වැටුප් සහ දිරි දීමනා | **6,939,396.19** | 6,537,733 |
| ආරක්ෂක ගාස්තු | **7,098,930.40** | 5,261,942 |
| ගොඩනැඟිලි අළුත්වැඩියා සහ නඩත්තු | **7,791,699.96** | 7,535,071 |
| කළමනාකරණ වැටුප් | **4,545,572.77** | 3,589,420 |
| විගණන ගාස්තු | **99,825.00** | 90,750 |
| වෙනත් පරිපාලන වියදම් | **9,884,946.73** | 10,196,299 |
| බෙදාහැරීමේ වියදම් | **7,232,959.00** | 8,986,705 |
| මූල්‍ය හා වෙනත් වියදම් | **1,311,289.70** | 1,209,922 |
| | **44,904,619.75** | 43,407,843 |

ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්
2014 දෙසැම්බර් 31 දිනට අවසන් වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

**06. දේපල, යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ**

| පිරිවැය | 2014/01/01 දිනට ශේෂය | එකතු කිරීම් | 2014/12/31 දිනට ශේෂය |
|---|---|---|---|
| ඉඩම | 220,000,000.00 | - | 220,000,000.00 |
| ගොඩනැගිල්ල | 69,325,599.28 | 3,986,360.00 | 73,311,959.28 |
| යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 136,762,036.39 | 1,018,594.40 | 137,780,630.79 |
| මෝටර් රථ | 13,258,750.00 | - | 13,258,750.00 |
| උපකරණ හා ආම්පන්න | 9,832,321.38 | 364,868.00 | 10,197,189.38 |
| විද්‍යාගාර උපකරණ | 4,921,850.00 | 270,480.00 | 5,192,330.00 |
| කෘෂිකාර්මික උපකරණ | 138,650.00 | - | 138,650.00 |
| විදුලි වැඩ | 1,092,746.45 | 35,000.00 | 1,127,746.45 |
| කාර්යාල උපකරණ | 8,213,062.74 | 2,228,568.88 | 10,441,631.62 |
| ගෘහභාණ්ඩ හා උපාංග | 3,543,598.70 | 9,250.00 | 3,552,848.70 |
| | 467,088,614.94 | 7,913,121.28 | 475,001,736.22 |

| සමුච්චිත ක්ෂය කිරීම් | 2014/01/01 දිනට ශේෂය | එකතු කිරීම් | 2014/12/31 දිනට ශේෂය |
|---|---|---|---|
| ගොඩනැගිල්ල | 4,220,616.60 | 3,600,055.80 | 7,820,672.40 |
| යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 16,004,599.73 | 13,683,060.52 | 29,687,660.25 |
| මෝටර් රථ | 2,087,042.17 | 2,651,750.00 | 4,738,792.17 |
| උපකරණ හා ආම්පන්න | 2,692,731.13 | 1,983,156.68 | 4,675,887.81 |
| විද්‍යාගාර උපකරණ | 553,729.50 | 501,201.00 | 1,054,930.50 |
| කෘෂිකාර්මික උපකරණ | 16,175.83 | 13,865.00 | 30,040.83 |
| විදුලි වැඩ | 523,755.59 | 216,721.37 | 740,476.96 |
| කාර්යාල උපකරණ | 1,105,776.44 | 879,979.40 | 1,985,755.84 |
| ගෘහභාණ්ඩ හා උපාංග | 431,044.22 | 355,130.70 | 786,174.92 |
| | 27,635,471.21 | 23,884,920.47 | 51,520,391.68 |

| ලියා තබන ලද අගයන් | 2014/12/31 රු. ශත | 2013/12/31 රු. |
|---|---|---|
| ඉඩම | **220,000,000.00** | 220,000,000.00 |
| ගොඩනැගිල්ල | **65,491,286.88** | 65,104,982.68 |
| යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | **108,092,970.54** | 120,757,436.66 |
| මෝටර් රථ | **8,519,957.83** | 11,171,707.83 |
| උපකරණ හා ආම්පන්න | **5,521,301.57** | 7,139,590.25 |
| විද්‍යාගාර උපකරණ | **4,137,399.50** | 4,368,120.50 |
| කෘෂිකාර්මික උපකරණ | **108,609.17** | 122,474.17 |
| විදුලි වැඩ | **387,269.49** | 568,990.86 |
| කාර්යාල උපකරණ | **8,455,875.78** | 7,107,286.30 |
| ගෘහභාණ්ඩ හා උපාංග | **2,766,673.78** | 3,112,554.48 |
| | **423,481,344.54** | 439,453,143.73 |

සැලකිය යුතුයි : ඉඩමෙහි ඔප්පුව සමාගම් මට්ටමින් ලබා ගත නොහැකිය.

ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්

2014 දෙසැම්බර් 31 දිනට අවසන් වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

| 7. භාණ්ඩලේඛණ | 2014/12/31 | 2013/12/31 |
|---|---|---|
| අමුද්‍රව්‍ය | රු. ශත | රු. |
| සෝයා | 104,928,119.74 | 56,235,686 |
| කිරි පිටි | 61,476,874.79 | 7,729,828 |
| බඩඉරිගු | 29,615,650.10 | 4,289,328 |
| විටමින් | 13,359,958.12 | 3,958,320 |
| මිනරල් | 3,573,050.11 | 13,254,810 |
| ක්‍රාෆ්ට් කඩදාසි බෑග් | 2,197,440.00 | 5,316,860 |
| පොලිතින් රිල් - ළමුන් | 1,348,984.00 | 2,870,097 |
| පොලිතින් බෑග්-රතු | 1,184,963.25 | 2,013,634 |
| පොලිතින් බෑග්-කහ | 250,804.76 | 1,166,295 |
| නූල් | 68,742.94 | 147,504 |
| පොලිතින් රිල් - මවුවරුන් | - | 1,776,946 |
| ඉංජිනේරු ගබඩා | 9,231,382.66 | 5,711,490 |
| ඩීසල් | 3,865,251.40 | 3,538,040 |
| පාවිච්චිකරන ලද පොලිතින් බෑග් | 78,292.00 | 78,292 |
| පාවිච්චිකරන ලද කිරි පිටි කවර | 6,171.00 | 6,171 |
| PP Wooven බෑග් | 2,911.01 | - |
| හිස් බහාලුම් | 166.73 | 167 |
| අපතය | 1,378.00 | 1,378 |
| නොනිමි තොග | 14,567,809.27 | 4,431,264 |
| නිශ්පාදනය කර අවසන් භාණ්ඩ | 39,550,477.97 | 16,192,484 |
| **එකතුව** | 285,308,427.85 | 128,718,592 |

| 08. වෙළඳ හා වෙනත් ලැබීම් | | |
|---|---|---|
| නිවාස ණය - වත්කම් ණය ගිණුම II | 24,472,838.95 | 17,688,014 |
| ණයකරුවන් | 10,963,841.92 | 4,011,700 |
| නිවාස ණය - ආපදා ණය ගිණුම II | 5,959,544.24 | 6,051,337 |
| නැවත ලබාදෙනු ලබන තැන්පතු මුදල් -ලං.වි.ම | 987,500.00 | 987,500 |
| විවිධ තැන්පතු සහ පූර්ව ගෙවීම් | 831,314.33 | 3,608,800 |
| විනෝද චාරිකා අත්තිකාරම් | 198,000.00 | 244,000 |
| උත්සව අත්තිකාරම් | 159,000.00 | 151,200 |
| කල් ඉකුත් නොවූ වියදම් | 154,901.72 | 189,982 |
| තැන්පතු | 150,676.00 | 152,041 |
| නිවාස ණය 5% | - | 382,749 |
| | 43,877,617.16 | 33,467,322 |

ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්
2014 දෙසැම්බර් 31 දිනට අවසන් වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

| | 2014/12/31 | 2013/12/31 |
|---|---|---|
| | රු. ශත | රු. |
| **09. ආයෝජන** | | |
| භාණ්ඩාගාර බිල්පත් - මුහුණත් වටිනාකම | **60,000,000.00** | 60,000,000 |
| ලැබිය යුතු භාණ්ඩාගාර බිල්පත් පොලී ආදායම | **200,274.72** | 456,528 |
| | **60,200,274.72** | 60,456,528 |
| **10. මුදල් හා මුදල් සමානයන්** | | |
| ලංකා බැංකුව, ජා-ඇල - 71324617 | **7,461,285.79** | 3,633,719 |
| ලංකා බැංකුව, ජා-ඇල - 72059803 | - | 273,931 |
| | **7,461,285.79** | 3,907,650 |

**11. ප්‍රකාශිත ප්‍රාග්ධනය**

2010-06-23 දින අමාත්‍ය මණ්ඩලය විසින් ගන්නා ලද තීරණයක ප්‍රතිඵලයක් ලෙස, ත්‍රිපෝෂ සමාගමේ කළමනාකාරිත්වය, 2007අංක 7 දරන සමාගම් පනත යටතේ සංස්ථාපනය කරන ලද සම්පූර්ණ රජය සතු පොදු සීමිත සමාගමක් වෙත පවරනු ලැබ ඇත. ඒ අනුව, රු. 304,600,000/=ක (රුපියල් තුන් මිලියන හයසිය දහසක්) ප්‍රකාශිත ප්‍රාග්ධනය සහිතව 2010 සැප්තැම්බර් මස 17වන දින ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ් සංස්ථාපනය කරන ලදී.

| | 2014/12/31 | 2013/12/31 |
|---|---|---|
| **12. ප්‍රාග්ධන සංචිත** | රු. ශත | රු. |
| වර්ෂය මුල ශේෂය | **152,382,926.64** | 147,354,856 |
| සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් ලද ප්‍රාග්ධන ප්‍රදාන | **7,913,121.28** | 27,425,002 |
| කිරාන් අතපත්තු මහතා (සුබසාධක අරමුදල) | **462,000.00** | - |
| අඩු කළා : වර්ෂය සඳහා ක්ෂය කිරීම් ගාස්තු | **(23,884,920.47)** | (22,396,932) |
| වර්ෂය අවසානයේ ශේෂය | **136,873,127.45** | 152,382,927 |
| **13. නැවත තක්සේරු කිරීමේ සංචිත** | | |
| වර්ෂය මුල ශේෂය | **307,170,027.56** | 307,170,028 |
| වර්ෂය තුල නැවත තක්සේරුකරණය කිරීම | - | - |
| වර්ෂය අවසානයේ ශේෂය | **307,170,027.56** | 307,170,028 |
| **14. විශ්‍රාම ප්‍රතිලාභ හිමිකම** | | |
| වර්ෂය මුල ශේෂය | **30,086,347.50** | 28,201,125 |
| අඩු කළා : වර්ෂය තුල ගෙවීම් | **(1,543,740.00)** | (1,776,360) |
| 2014 වර්ෂය සඳහා ප්‍රතිපාදන | **(411,927.50)** | 3,661,583 |
| වර්ෂය අවසානයේ ශේෂය | **28,130,680.00** | 30,086,348 |

| | | |
|---|---|---|
| **වට්ටම් අනුපාතය** | 12% | 12% |
| **ඉදිරි වැටුප් වර්ධක අනුපාතය** | 10% | 10% |
| **කාර්ය මණ්ඩල පිරිවැටුම** | 2% | 2% |
| **විශ්‍රාම ගැනීමේ වයස** | අවුරුදු 55 | අවුරුදු 55 |

ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්
2014 දෙසැම්බර් 31 දිනට අවසන් වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

| | 2014/12/31 | 2013/12/31 |
|---|---|---|
| | රු. ශත | රු. |
| **15. වෛද්‍ය අරමුදල** | | |
| වර්ෂය මුල ශේෂය | **62,794.50** | 64,657 |
| වර්ෂය තුල දායකත්ව | **190,158.00** | 103,600 |
| වර්ෂය තුල ගෙවීම් | **(111,788.54)** | (105,462) |
| වර්ෂය අවසානයේ ශේෂය | **141,163.96** | 62,795 |
| **16. වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු** | | |
| ණයහිමියන් | **44,465,678.75** | 21,903,672 |
| වැටුප් පාලන | **494,288.45** | - |
| ගෙවිය යුතු විගණන ආදායම් | **190,575.00** | 90,750 |
| ආපසු ගෙවනු ලබන තැන්පතු | **153,237.50** | 153,238 |
| වියදම් සඳහා ප්‍රතිපාදන | **34,088.49** | 93,272 |
| | **45,337,868.19** | 22,240,932 |

**17. ප්‍රාග්ධන ප්‍රදාන හා සම්බන්ධ ක්ෂය කිරීම්**

සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ප්‍රදානය කර ඇති ස්ථිර වත්කම්වලට සම්බන්ධ ක්ෂය කිරීම්, එම වර්ෂයේ මුළු ක්ෂය කිරීමේ ගාස්තු අඩු කරමින් අදාල ප්‍රාග්ධන ප්‍රදාන ගිණුමට අයකරගනු ලැබ ඇත.

**18. වගකීම් සහ අවිනිශ්චිතතා**

වාර්තා කරනු ලබන දිනයේදී කිසිදු කැපී පෙනෙන වගකීමක් හෝ අවිනිශ්චිතතාවක් නොපැවතිණි.

**19. සම්බන්ධ ප්‍රකාශ අනාවරණය කිරීම්**

**ප්‍රධාන පෙලේ කාර්යමණ්ඩල සාමාජිකයින් හා පවත්නා ගණුදෙණු**

සමාගමෙහි ප්‍රධාන පෙලේ කාර්යමණ්ඩල සාමාජිකයින් වනුයේ, එහි අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයෝ ය.

**20. වාර්තා කරනු ලබන දිනට පසු ඇති වන සිදුවීම්**

වාර්තා කරනු ලබන දිනට පසු මූල්‍ය ප්‍රකාශයන්හි ගැලපුම් සිදු කිරීමට හෝ අනාවරණය කිරීමට අවශ්‍ය වන පරිදි කිසිදු වැදගත් සිදුවීමක් ඇති වී නොමැත.

**21. මිශ්‍රණයේ සංයුතිය**

සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් නිර්දේශ කරනු ලැබ ඇති පරිදි, වර්ෂය තුල භාවිත කරන ලද මිශ්‍රණයේ සංයුතිය පහත සඳහන් පරිදි වේ.

| | නිර්දේශිත | සත්‍ය | විචල්‍යතාව |
|---|---|---|---|
| ඉරිඟු | 66.00% | 67.21% | 1.21% |
| සෝයා | 30.00% | 29.11% | -0.89% |
| කිරි | 3.00% | 2.78% | -0.22% |
| විටමින් | 0.10% | 0.82% | 0.72% |
| ඛනිජ | 0.90% | 0.09% | -0.81% |

| **22. ප්‍රමිතිගත අපතේ යාම** | තෙතමනය | ක්‍රියාවලිය | මුළු |
|---|---|---|---|
| ඉරිඟු | 14.00% | 6.50% | 20.50% |
| සෝයා | 12.00% | 9.50% | 21.50% |
| කිරි | 4.00% | 0.00% | 4.00% |
| විටමින් | 3.00% | 0.00% | 3.00% |
| ඛනිජ | 3.00% | 0.00% | 3.00% |

**23. අමුද්‍රව්‍ය භාවිතය (වටිනාකමින්)**

| | ප්‍රමාණය | වටිනාකම | කිලෝග්‍රෑමයක සාමාන්‍ය වටිනාකම (සත්‍ය) | කිලෝග්‍රෑමයක වටිනාකම (සත්‍ය) | අයවැය මත විචල්‍යතාව |
|---|---|---|---|---|---|
| | | රු. ශත | රු. ශත | රු. ශත | රු. ශත |
| තිරිඟු (කිග්‍රෑ) | 10,275,266 | 482,187,019.90 | 46.93 | 51.52 | 4.59 |
| සෝයා (කිග්‍රෑ) | 4,449,607 | 460,648,860.06 | 103.53 | 137.76 | 34.23 |
| කිරි (කිග්‍රෑ) | 424,450 | 328,838,319.74 | 774.74 | 509.00 | (265.74) |
| ඛනිජ (පැකට්) | 124,650 | 32,046,102.71 | 257.09 | 327.00 | 69.91 |
| විටමින් (පැකට්) | 13,550 | 35,321,011.49 | 2,606.72 | 3,600.00 | 993.28 |
| ක්‍රාෆ්ට් ජේපර් (බෑග්) | 623,900 | 21,968,095.97 | 35.21 | 25.85 | (9.36) |
| පොලිතින් (බෑග්) | 9,728,050 | 42,268,867.31 | 4.35 | 4.00 | (0.35) |
| ටවයින් | 1,416 | 269,869.73 | 190.59 | 228.00 | 37.41 |

**24. නිෂ්පාදනය**

| | අයවැයගත | සත්‍ය | විචල්‍යතාව |
|---|---|---|---|
| නිෂ්පාදිත මාස්ටර් බෑග් ප්‍රමාණය | 710,346 | 621,068 | (89,278) |
| බෙදාහැරීමේ සහ වෙනත් වියදම් ඇතුළු නිෂ්පාදන පිරිවැය (රු.) | 2,782,373,853.00 | 1,672,809,605.89 | 1,109,564,247.11 |
| මාස්ටර් බෑගයක් සඳහා පිරිවැය | 3,916.93 | 2,693.44 | 1,223.49 |

ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්
2014 දෙසැම්බර් 31 දිනට අවසන් වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශ සඳහා **විස්තරාත්මක** සටහන්

| | | 2014/12/31 | 2013/12/31 |
|---|---|---|---|
| 01. <u>වර්ෂය තුල ප්‍රතිපූර්ණ වියදම්</u> | | රු. ශත | රු. |
| සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් ලද වියදම් ප්‍රතිපූර්ණය කිරීම | | **1,776,560,231.70** | 1,376,671,526 |
| ලෝක ආහාර වැඩසටහන සඳහා ත්‍රිපෝෂ සැපයීමෙන් ලද ආදායම් | | - | <u>4,529,970</u> |
| | | **1,776,560,231.70** ============ | 1,381,201,496 ========== |
| 02. <u>නිෂ්පාදන පිරිවැය</u> | | | |
| අමුද්‍රව්‍ය භාවිතය | 02.1 | **1,429,613,560.69** | 1,190,839,956 |
| සෘජු ශ්‍රමය | 02.2 | **109,605,729.30** | 101,811,367 |
| කර්මාන්තශාලාවේ වියදම් සඳහා වෙන් කරන ලද මුදල | 02.3 | **<u>89,129,409.50</u>** | <u>85,610,450</u> |
| මූලික පිරිවැය | | **1,628,348,699.49** | 1,378,261,773 |
| එකතු කළා : වර්ෂය මුල නිම කළ නිෂ්පාදිත | | **16,192,484.30** | 20,730,175 |
| වර්ෂය මුල අවසන් සුළු නිෂ්පාදිත | | **86,007.73** | 101,939 |
| අඩු කළා : වර්ෂය අවසානයේ නිම කළ නිෂ්පාදිත | | **(39,550,477.97)** | (16,192,484) |
| වර්ෂය අවසානයේ සුළු නිෂ්පාදිත | | **(86,007.73)** | (86,008) |
| නැවත සකස්කිරීමේ අලාභය | | **<u>(443,713.33)</u>** | <u>(544,244)</u> |
| | | **1,604,546,992.49** =========== | 1,382,271,151 ========== |
| 02.1 <u>අමුද්‍රව්‍ය භාවිතය</u> | | | |
| ආරම්භක තොගය | | **98,759,306.00** | 120,232,592 |
| එකතු කළා : මිලදී ගැනීම් | | | |
| තිරිඟු | | **507,513,342.50** | 373,048,208 |
| සෝයා | | **509,341,294.30** | 425,762,448 |
| කිරි පිටි | | **382,585,366.70** | 207,828,125 |
| පෙර මිශ්‍රිත විටමින් | | **22,364,343.20** | 36,461,740 |
| විටමින් | | **44,722,650.10** | 41,970,600 |
| ක්‍රාෆ්ට් පේපර් බෑග් | | **18,848,676.00** | 21,339,472 |
| පොලිතින් බෑග් (රතු සහ කහ) | | **40,524,706.40** | 57,819,423 |
| මල්ටි ලේයර් ෆිල්ම් (මව්වරුන් සහ දරුවන්) | | **32,903,900.20** | 4,228,320 |
| ටවයින් | | **191,108.60** | 191,109 |
| අවසන් තොගය | | **<u>(218,004,587.81)</u>** | <u>(98,759,306)</u> |
| | | **1,439,750,106.20** | 1,190,122,730 |
| එකතු කළා : වර්ෂය මුල නිම නොකළ වැඩ | | **4,431,263.70** | 5,148,490 |
| අඩු කළා : වර්ෂය අවසානයේ නිම නොකළ වැඩ | | **<u>(14,567,809.23)</u>** | <u>(4,431,264)</u> |
| | | **1,429,613,560.69** ============ | 1,190,839,956 ========== |

ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්
2014 දෙසැම්බර් 31 දිනට අවසන් වර්ෂය සඳහා වන
මූල්‍ය ප්‍රකාශ සඳහා විස්තරාත්මක සටහන්

| | 2014/12/31 | 2013/12/31 |
|---|---|---|
| 02.2 ඍජු ශ්‍රම සහ කළමනාකරණ පිරිවැය | රු. ශත | රු. |
| කර්මාන්තශාලා වැටුප් සහ වේතන | | |
| මූලික වැටුප | **39,763,615.87** | 41,957,206 |
| අතිකාල දීමනා | **16,919,512.41** | 15,343,231 |
| ජීවන වියදම | **16,762,296.45** | 13,790,836 |
| සේවක අර්ථසාධක අරමුදල | **6,531,660.19** | 4,340,089 |
| දිරිදීමනා | **5,527,310.82** | 6,182,386 |
| ඉලක්ක | **3,433,290.86** | 3,386,822 |
| නිවාඩු දීමනා | **3,318,386.37** | 2,372,372 |
| සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල | **1,642,073.07** | 1,089,129 |
| ආහාර දීමනාව | **887,534.72** | 761,641 |
| විශේෂ දීමනාව | **619,857.67** | 100,500 |
| සේවා මුර දීමනාව | **592,165.00** | 501,945 |
| වෛද්‍ය සේවා ප්‍රතිගෙවුම් | **222,212.50** | 194,772 |
| කළමනාකරණ ගාස්තු | **96,443.50** | 122,750 |
| වගකීම් | **9,506.00** | 5,151 |
| පාරිතෝෂිත | - | 2,929,270 |
| පර්යන්ත ගෙවීම් | - | 29,341 |
| ගිවිසුම්ගත වේතන | | |
| කර්මාන්තශාලාවේ බාහිර ගබඩා | **2,453,380.25** | 813,934 |
| අතිකාල දීමනා | **1,516,291.07** | 595,067 |
| සේවක අර්ථසාධක අරමුදල | **616,232.17** | 162,491 |
| සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල | **154,057.96** | 40,623 |
| වෙනත් ගිවිසුම්/සීඑල් | **1,067,579.54** | 663,524 |
| සුබසාධන සහ වෛද්‍ය | | |
| නිලඇඳුම්, හිස් ආවරණ සහ සේදුම් | **3,729,457.33** | 3,055,506 |
| තේ වියදම් | **2,527,712.00** | 2,157,690 |
| කාර්යමණ්ඩල සුබසාධනය | **37,655.90** | 92,000 |
| **ගෑස් සහ අනෙකුත් ආපනශාලා වියදම්** | **455,422.90** | 511,401 |
| වෛද්‍ය/වෙනත් උපදෙස් ලබා ගැනීම් | **323,963.25** | 243,573 |
| වෛද්‍යමය ප්‍රතිපූර්ණය කිරීම් | **385,649.00** | 337,891 |
| පුවත්පත් සහ කාලීන සඟරා | **12,462.50** | 30,225 |
| | **109,605,729.30** | 101,811,367 |

| ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්<br>2014 දෙසැම්බර් 31 දිනට අවසන් වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශ සඳහා විස්තරාත්මක සටහන් | 2014/12/31<br>රු. ශත | 2013/12/31<br>රු. |
|---|---|---|
| 02.3 සෘජු වියදම් සඳහා වෙන් කරන ලද මුදල | | |
| විද්‍යුත් බොයිලේරුව සහ විදුලි ජනක ඉන්ධන | **61,746,548.41** | 54,873,202 |
| යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ නඩත්තු | **22,351,262.34** | 24,996,750 |
| සෘජු නොවන නිෂ්පාදන අමුද්‍රව්‍ය | **343,376.40** | 196,763 |
| රක්ෂණ | **921,464.41** | 827,060 |
| වාහන අළුත්වැඩියා ගාස්තු | **323,375.17** | 1,152,493 |
| කර්මාන්තශාලා නඩත්තු ගාස්තු | **690,107.01** | 718,689 |
| ඉන්ධන - මෝටර් රථ | **699,473.20** | 931,219 |
| වරිපනම් සහ බදු | **296,849.74** | 8,500 |
| කෘමි පාලනය | **616,666.51** | 384,523 |
| රසායනික දුම් ගැසීම | **443,175.60** | 100,423 |
| කර්මාන්තශාලාව සඳහා වෙන් කරන ලද වෙනත් මුදල් | **162,603.51** | 559,923 |
| දුරකථන | **302,120.99** | 257,949 |
| වෙනත් රසායනාගාර වියදම් | **111,414.00** | 494,907 |
| බලපත්‍ර සහ රක්ෂණ | **113,696.71** | 107,605 |
| වෛද්‍ය මධ්‍යස්ථාන නඩත්තු | **7,275.50** | 445 |
| | **89,129,409.50** | 85,610,450 |
| 03. වෙනත් ආදායම් | | |
| අපතය විකුණුම් | **11,651,848.70** | 10,175,630 |
| භාණ්ඩාගාර බිල්පත් මත පොලී ආදායම | **5,443,746.72** | 6,787,847 |
| ගෝනි විකුණුම් | **2,068,769.50** | 3,955,398 |
| නිවාස ණය පොලිය | **1,469,059.28** | 814,674 |
| වෙනත් ආදායම් | **145,610.33** | 2,337,678 |
| විවිධ සුළු ආදායම් | **308,837.10** | 291,917 |
| කිරාන් අතපත්තු මහතාගෙන් ලද පරිත්‍යාග | - | 259,000 |
| | **21,087,871.63** | 24,622,143 |

ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්
2014 දෙසැම්බර් 31 දිනට අවසන් වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශ සඳහා **විස්තරාත්මක** සටහන්

| | 2014/12/31 | 2013/12/31 |
|---|---|---|
| **04. පරිපාලන වියදම්** | රු. ශත | රු. |
| ගොඩනැගිලි අළුත්වැඩියා හා නඩත්තු | **7,791,699.96** | 7,535,071 |
| ආරක්ෂක ගාස්තු | **7,098,930.40** | 5,261,942 |
| මූලික වැටුප් | **6,095,071.49** | 5,662,495 |
| කළමනාකරණ ගාස්තු | **4,545,572.77** | 3,589,420 |
| කාර්යමණ්ඩල සුබසාධනය | **1,550,191.00** | 1,897,658 |
| ජීවන වියදම | **1,432,550.00** | 1,155,000 |
| සේවක අර්ථසාධක අරමුදල | **1,004,287.74** | 502,568 |
| අතිකාල | **963,300.51** | 966,800 |
| ලිපිද්‍රව්‍ය | **880,016.68** | 1,132,571 |
| ප්‍රචාරණය | **747,852.00** | 445,088 |
| දීමනා | **464,720.00** | 384,250 |
| තැපැල් ගාස්තු | **391,233.00** | 264,671 |
| නිවාඩු දීමනා | **351,646.35** | 371,941 |
| සේවක නියුක්තිකයින්ගේ භාරකාර අරමුදල | **241,911.42** | 121,535 |
| දුරකථන ගාස්තු | **196,560.58** | 215,234 |
| රක්ෂණ ගාස්තු | **195,432.41** | 281,062 |
| ලිපිද්‍රව්‍ය - පරිපාලන | **178,627.27** | 132,268 |
| සාමාන්‍ය වියදම් | **164,339.57** | 271,227 |
| රියැදුරු යැපුම් දීමනාව | **161,375.00** | 170,475 |
| මුද්‍රණ | **129,240.00** | 3,500 |
| උද්‍යාන නඩත්තු | **128,483.98** | 125,897 |
| කාර්යාල උපකරණ නඩත්තු | **125,052.00** | 138,523 |
| නිල ඇඳුම් දීමනාව | **125,000.00** | - |
| සනීපාරක්ෂක | **106,219.17** | 160,738 |
| විගණන ගාස්තු | **99,825.00** | 90,750 |
| කාර්යමණ්ඩල පුහුණු කිරීමේ ගාස්තු | **73,500.00** | 122,160 |
| තේ වියදම් | **70,226.00** | 185,941 |
| වෙනත් වියදම් | **54,940.05** | 140,228 |
| නෛතික වියදම් | **54,600.00** | - |
| අළුත්වැඩියා කිරීම් - මෝටර් රථ | **46440.00** | 71,084 |
| ඉන්ධන - මෝටර් රථ | **31,810.00** | 135,399 |
| මුද්‍රණ අමුද්‍රව්‍ය | **15,392.00** | 53,575 |
| දිරි දීමනා | **844,324.70** | 875,239 |
| පාරිතෝෂිත | - | 732,317 |
| පොත් හා කාලීන සඟරා | - | 14,590 |
| | **36,360,371.05** | **33,211,216** |

| ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්<br>2014 දෙසැම්බර් 31 දිනට අවසන් වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශ සඳහා විස්තරාත්මක සටහන් | 2014/12/31<br>රු. ශත | 2013/12/31<br>රු. |
| --- | --- | --- |
| **05. බෙදාහැරීමේ පිරිවැය** | | |
| ප්‍රවාහන ගාස්තු | **7,232,959.00** | 8,975,470 |
| බෙදාහැරීමේ ගාස්තු | - | 11,235 |
| | **7,232,959.00**<br>========= | 8,986,705<br>======== |
| **06. මූල්‍ය හා වෙනත් වියදම්** | | |
| බැංකු ගාස්තු | **867,576.37** | 55,303 |
| නැවත සකස්කිරීමේ අලාභය | **443,713.33** | 135,148 |
| කාර්යමණ්ඩල ණය පිරිවැය | - | 544,244 |
| මුද්දර ගාස්තු | - | 475,227 |
| | **1,311,289.70**<br>========= | 1,209,922<br>======== |

83/1/2, සුභද්‍රාරාම මාවත,
ගංගොඩවිල, නුගේගොඩ, ශ්‍රී ලංකාව.
දුරකථන අංක : +94 11 2822 164
ෆැක්ස් අංකය : +94 11 2372317

**කපිල රත්නසිංහ සහ සමාගම**
**(වරලත් ගණකාධිකාරිවරුන්)**

ජංගම දුරකථන අංක:+94 716840 945
විද්‍යුත් තැපෑල : krc@krathnasinghe.com
වෙබ් අඩවිය : www.krathnasignhe.com

**2016 මැයි 11වන දින**

අධ්‍යක්ෂ මණ්ඩලය
ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්,
තැ.පෙ.අංක 17, කපුවත්ත,
ජා ඇල.

හිතවත් මහත්මයාණෙනි,

**ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ් (පීබී 3873)**
**2014 දෙසැම්බර් 31 දිනට අවසන් වන වර්ෂය සඳහා වන විගණනය**

2014 දෙසැම්බර් 31 දිනට අවසන් වන වර්ෂය සඳහා ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ් (සමාගම) හි විගණකවරුන් ලෙස, පෙර කී කාලසීමාව තුළ ඔබගේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් පල කිරීම අපගේ මූලික වගකීම විය. කෙසේ වුවද, අපගේ පාරිභෝගිකයින් වෙත උපරිම වටිනාකමක් ලබා දීමේ අප සමාගමෙහි සම්ප්‍රදාය අනුව යමින්, අප වෙර දරනුයේ ඔබගේ ගිණුම්කරණ ගැටලු සඳහා වටිනාකමින් යුතු අදහස්, තොරතුරු සහ විසඳුම් ඔබ වෙත ලබාදීමෙන්, අපගේ ව්‍යවස්ථාපිත වගකීම අභිබවා විහිද යන සේවාවක් ඔබ වෙත ලබා දීමයි. මෙම ලේඛනයෙහි අරමුණ වනුයේ, 2014 දෙසැම්බර් 31 දිනට අවසන් වන වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනයන්හි අප විසින් සිදු කළ විගණනයෙහිදී පැන නැඟි මූලික කරුණු දක්වා ලීමයි.

1. සමාගම විසින් ඵලදායී පාලන ක්‍රමවේදයක් ලෙස අයවැය භාවිත කරනු නොලැබ ඇති බවත්, වාර්ෂික ඉලක්කගත නිෂ්පාදිතය සහ පිරිවැය පාලනය කිරීම සපුරාලීම පිණිස සමාගම විසින් යථාර්ථවාදී අයවැය පාලනය කිරීම ක්‍රියාත්මක කරනු නොලැබ ඇති බවත් අප විසින් නිරීක්ෂණය කරන ලදී.

1.1.1 **2013 වර්ෂය හා සසඳන විට සමාගමේ කාර්යසාධනය පිළිබඳ සංඛ්‍යා ලේඛන**

| විෂයය | 2012 (අ) | 2013 (ආ) | 2014 (ඇ) | වෙනස (ඇ - ආ) | ප්‍රතිඵලය |
|---|---|---|---|---|---|
| නිෂ්පාදනය (මාස්ටර් බෑග්) | 490,452 | 502,263 | 621,068 | 118,805 | වැඩිදියුණු වී ඇත |
| නිෂ්පාදන පිරිවැය (රු.) | 1,320,424,700 | 1,425,678,994 | 1,649,451,612 | 223,772,618 | පිරිවැය වැඩි වී ඇත |
| මාස්ටර් බෑගයක පිරිවැය (රු.) | 2,692.26 | 2,838.51 | 2,655.83 | (182.68) | 6.44%කින් පිරිවැය අඩු වී ඇත |
| සෘජු ශ්‍රමය සහ කළමනාකරණ පිරිවැය (රු.) | 100,770,309 | 101,811,367 | 109,605,729 | 7,794,362 | 7.66% කින් පිරිවැය වැඩි වී ඇත |
| පරිපාලන පිරිවැය (රු.) | 25,083,563 | 33,211,216 | 36,360,371 | 3,149,155 | 9.48% කින් පිරිවැය වැඩි වී ඇත |

2. <u>ඉඩම සඳහා ලේඛනගත සාක්ෂි</u>

<u>නිරීක්ෂණ</u>

ගිණුම්වල සඳහන් රු. 220,000,000/-ක් වන ඉඩමෙහි වටිනාකම තහවුරු කිරීම පිණිස, සමාගම විසින් කිසිදු පිළිගත නොහැකි ලේඛනයක් ඉදිරිපත් කරනු ලැබ නොමැති බව අප විසින් නිරීක්ෂණය කරන ලද්දෙමු.

<u>නිරීක්ෂණ</u>

සමාගම් පරිශ්‍රය සඳහා හිමිකම් ඔප්පු ලබා ගැනීමට අපි නිර්දේශ කරමු.

<u>කළමනාකරණ අදහස් දැක්වීම්</u>

ඉහත සඳහන් ඉඩම සඳහා නව ඔප්පුවක් සකස් කිරීම පිණිස පියවර ගැනීමට විගණන හා කළමනාකරණ කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

3. <u>භාණ්ඩ ලේඛනවල භෞතික තහවුරු කරගැනීම</u>

<u>නිරීක්ෂණ</u>

2014 දෙසැම්බර් 31 දිනට සිදු කරනු ලබන භාණ්ඩ ලේඛනවල භෞතික තහවුරු කරගැනීම නිරීක්ෂණය කිරීම පිණිස, සමාගම විසින් විගණකවරුන් වෙත ආරාධනා කරනු ලැබ නොමැති බව අප විසින් නිරීක්ෂණ කරනු ලැබ ඇත්තෙමු.

<u>නිර්දේශය</u>

වර්ෂය අවසානයේ භාණ්ඩ ලේඛන ගණනය කිරීම නිරීක්ෂණය කිරීමට විගණකවරුන් වෙත ආරාධනා කරන ලෙස අපි නිර්දේශ කරන්නෙමු.

<u>කළමනාකරණ අදහස් දැක්වීම්</u>

2015 වර්ෂයේ සිට තොග තහවුරු කරගැනීම උදෙසා බාහිර විගණකවරුන් වෙත ආරාධනා කිරීම විගණන හා කළමනාකරණ කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

4. <u>විදුලි තැන්පතුව - කොළඹ</u>

<u>නිරීක්ෂණ</u>

රු. 200,000/- වන කොළඹ විදුලි තැන්පතුව තහවුරු කරගැනීම පිණිස, සමාගම විසින් කිසිදු ලේඛනයක් ඉදිරිපත් කරනු ලැබ නොමැති බව අප විසින් නිරීක්ෂණය කරනු ලැබ ඇත්තෙමු.

<u>නිර්දේශය</u>

ඉදිරි දිනවලදී සමාගම විසින් මෙම ශේෂය නැවත අය කරගැනීමට හැකිවන පරිදි, මෙම තැන්පතුව සම්බන්ධයෙන් නිසි ලේඛන පවත්වා ගෙන යාම අපි නිර්දේශ කරමු.

<u>කළමනාකරණ අදහස් දැක්වීම්</u>

අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව, ගිණුම් පොත්වලින් මෙම ශේෂය ඉවත් කිරීමට විගණන හා කළමනාකරණ කමිටුව විසින් තීරණය කරන ලදී.

5. අත්තිකාරම් සහ පූර්ව ගෙවීම්

නිරීක්ෂණ

අදාල වියදම් ගිණුම්වලට අයකර ගැනීම පිණිස තහවුරු කිරීමේ ලේඛන නොමැති වීම හේතුවෙන්, 2014 වර්ෂය සඳහා සමාගමේ විවිධ ප්‍රසම්පාදන කටයුතු උදෙසා ගෙවන ලද පහත සඳහන් අත්තිකාරම් තවමත් අත්තිකාරම් ගිණුමෙහි පවතී. එම තොරතුරු පහත පරිදි වේ :

| අංකය | ගෙවීම් දිනය | අත්තිකාරම් විස්තර | වටිනාකම රු. | අත්තිකාරම් ගිණුමේ දින ගණන |
|---|---|---|---|---|
| 01. | 04-04-14 | ගයාත්‍රි මධුෂානි- ජාතික සුදුසුකම් සහතිකය | 8,000.00 | 271 |
| 02. | 30-04-14 | එල්කාර්ඩෝ ඉන්ඩස්ට්‍රීස් (පුද්ගලික) සමාගම | 50,105.38 | 245 |

ගම්‍ය වන කරුණු

- වියදම් ඌන ප්‍රකාශය
- වත්කම් අතිශයෝක්තියෙන් වාර්තා කිරීම

නිර්දේශය

මෙම පූර්ව ක්‍රියාමාර්ග අනුගමනය කර, අදාල ගිණුම් සටහන් ලෙජර් ගිණුමට ඇතුලත් කරන ලෙස අප විසින් නිර්දේශ කරන ලදී.

කළමනාකරණ අදහස් දැක්වීම්

1. 2014 අප්‍රේල් මස 04වන දින රු.8,000ක අත්තිකාරම් මුදලක් ලබා ගෙන ඇති අතර, 2015/05/11 වන දින කුවිතාන්සි අංක 11724 මඟින් එය පියවනු ලැබ ඇත.

2. 2014 අප්‍රේල් මස 30 වන දින ලබා ගත් රු. 50,105/38 ක අත්තිකාරම් මුදල 2015 වර්ෂයේ ගිණුම් තුළ ගැලපුම් සිදු කරනු ලැබ ඇත.

6. 2006 අංක 06 දරන දේශීය ආදායම් පනත සහ පොලී ආදායම් සඳහා සිදු කරන ලද කාලීන සංශෝධන

නිරීක්ෂණ

ලාභ සහ ආදායම් 7b.(ixvi) වගන්තිය ප්‍රකාරව, ශ්‍රී ලංකා රජය වෙනුවෙන් සපයනු ලබන සේවාවන්හි ප්‍රමාණය මත, ඕනෑම රාජ්‍ය සංස්ථාවකින් ලබන ලාභාංශ හෝ පොලී හරහා උපයනු ලබන ලාභ සහ ආදායම් හැර අන් සියලුම ලාභ සහ ආදායම්, පාර්ලිමේන්තුව විසින් ඒකාබද්ධ අරමුදලෙන් ලබා දෙනු ලබන අරමුදල්වලින් හෝ රජය විසින් සම්පාදනය කරනු ලබන ඕනෑම ණය මුදලකින් හෝ නිදහස් වේ. ඒ අනුව, රු. 5,443,746.72 ක් වන භාණ්ඩාගාර බිල්පත්වලින් ලද පොලී ආදායම, ආදායම් බදුවලට යටත් වන අතර, සමාගම විසින් එම පොලී ආදායම මත ආදායම් බදු වගකීම දරා නොමැත.

කළමනාකරණ අදහස් දැක්වීම්

ලාභ නොලබන පූර්ණ රජය සතු සමාගමක් ලෙස ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්හි බදු වගකීම පිළිබඳ තොරතුරු ලබා ගැනීමට විගණන සහ කළමනාකරණ කමිටුව විසින් තීරණය කරන ලදී.

## 7. මුදල් සහ මුදල් සමානයන්

### 7.1 ලංකා බැංකුව - ජා ඇල - 71324617

නිරීක්ෂණ

සමාගම විසින් කාලීනව සිය බැංකු සැසඳුම් ප්‍රකාශය පරීක්ෂා කර නොමැති බව අප විසින් නිරීක්ෂණය කරන ලද්දෙමු. නිදසුනක් ලෙස, චෙක්පත ලියන ලද දිනයේ සිට මාස 06කට පසු නිෂ්කාශනය කරන ලද චෙක්පතක් තිබිණි.

උදා : 2014 පෙබරවාරි 19දිනැති චෙක් අංක 382093, නිෂ්කාශනය කර ඇත්තේ 2015 මාර්තු මස 17 වන දිනදී ය.

ගම්‍ය වන කරුණු

- සමාගමේ ක්‍රියාත්මක කරන ලද අභ්‍යන්තර පාලනයන් ක්‍රියාකාරී නොවීම.
- එය, බැංකු සැසඳුම් ප්‍රකාශය තුල නොසැසඳු ශේෂයක් බවට පත් විය හැකි වීම.
- බැංකු සැසඳුම් ප්‍රකාශ තුල හඳුනා නොගත් දෝෂ පැවතිය හැකි වීම.
- වත්කම් අනිසි පරිහරණය සිදු විය හැකි වීම.

නිර්දේශය

මාසික පදනම මත, සකස් කරන ලද බැංකු සැසඳුම් ප්‍රකාශ පරීක්ෂා කිරීම සඳහා පුද්ගලයෙකු පත් කිරීම.

කළමනාකරණ අදහස් දැක්වීම්

මාසික පදනම මත බැංකු සැසඳුම් ප්‍රකාශ සකස් කිරීම සඳහා පුද්ගලයෙකු සිටිය යුතු බව විගණන සහ කළමනාකරණ කමිටුව විසින් දන්වා සිටින ලදී.

### 7.2 සංචරණ මුදල්හි ආරක්ෂිත බව

නිරීක්ෂණ

සංචරණ මුදල්හි ආරක්ෂිත බව සම්බන්ධයෙන් සමාගම විසින් කිසිදු පියවරක් ගෙන නොමැති බව අපි නිරීක්ෂණය කළෙමු.

ගම්‍ය වන කරුණු

සංචරණ මුදල් වෙනුවෙන් නිසි රක්ෂණාවරණයක් නොමැතිකම හේතුවෙන්, එවැනි මුදල් සොරකම් කරනු ලැබීමකදී හෝ නැතිවීමකදී සමාගමට ඉතා විශාල පාඩුවක් භුක්ති විඳීමට සිදු වනු ඇත.

නිර්දේශය

අවදානම අවම කිරීමේ අරමුණින්, නිසි රක්ෂණාවරණයක් ලබා ගැනීම අපි නිර්දේශ කළෙමු.

කළමනාකරණ අදහස් දැක්වීම්

විගණන හා කළමනාකරණ කමිටුවේ මතය වනුයේ, බැංකු හරහා සියලු වැටුප් ගණුදෙණු සිදුවන හෙයින් හා සමාගමේ කිසිදු සුවිශේෂී මුදල් ගණුදෙණුවක් නොමැති හෙයින්, සංචරණ මුදල් වෙනුවෙන් කිසිදු රක්ෂණාවරණයක අවශ්‍යතාවක් නොමැති බවයි.

**8. <u>ප්‍රකාශිත ප්‍රාග්ධනය</u>**

**<u>නිරීක්ෂණ</u>**

සමාගම විසින් විගණකවරුන් වෙත මෑත කාලීන වාර්ෂික ලාභ (ආකෘතිපත්‍රය 15) ලබා දී නොමැති බව අපි නිරීක්ෂණය කළෙමු. සිදු කරන ලද විගණකවරුන්ගේ ලිපි ගොනු සොයා බැලීමේදී, සමාගමේ ප්‍රකාශිත ප්‍රාග්ධනය රු. 304,600,000/- ක් වන බවත්, එම ප්‍රකාශිත ප්‍රාග්ධන වටිනාකම මූල්‍ය ප්‍රකාශ තුල පෙන්නුම් නොකෙරෙන බව අපි නිරීක්ෂණය කළෙමු.

**<u>නිර්දේශය</u>**

සමාගම් රෙජිස්ට්‍රාර් වෙත කලින් කලට වාර්ෂික ලාභ ඉදිරිපත් කරන ලෙසත්, ප්‍රකාශිත ප්‍රාග්ධන ශේෂය මූල්‍ය ප්‍රකාශ තුල ඇතුලත් කරන ලෙසත් අපි නිර්දේශ කරමු.

**<u>කළමනාකරණ අදහස් දැක්වීම</u>**

ඉහත දැක්වෙන කරුණ මූල්‍ය ප්‍රකාශනවලට සටහනක් ලෙස අනාවරණය කිරීම විගණන හා කළමනාකරණ කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

**9. <u>පෙර වර්ෂය හා සැසඳීමේදී වියදම් ඉහළ යාම</u>**

**<u>නිරීක්ෂණ</u>**

| | 2014 | 2013 | විචල්‍යතාව % |
|---|---|---|---|
| **පරිපාලන වියදම්** | | | |
| ආරක්ෂක ගාස්තු | 7,098,930.40 | 5,261,941.61 | 34.91 |
| කළමනාකරණ ගාස්තු | 4,545,572.77 | 3,589,420.26 | 26.64 |
| ජීවන වියදම | 1,432,550.00 | 1,155,000.00 | 24.03 |
| සේවක අර්ථසාධක අරමුදල | 1,004,287.74 | 502,567.90 | 99.83 |
| ප්‍රචාරණය | 747,852.00 | 445,088.00 | 68.02 |
| දීමනා | 464,720.00 | 384,250.00 | 20.94 |
| තැපැල් ගාස්තු | 391,233.00 | 264,671.00 | 47.82 |
| **මූල්‍ය හා වෙනත් වියදම්** | | | |
| නැවත සකස්කිරීමේ අලාභය | 800,159.37 | 135,147.95 | 492.06 |

| | | | |
|---|---|---|---|
| **ඍජු ශ්‍රමය සහ කළමනාකරණ පිරිවැය** | | | |
| ජීවන වියදම | 16,762,296.45 | 13,790,836.43 | 21.55 |
| බාහිර කර්මාන්තශාලා ගබඩා | 2,453,380.25 | 813,933.71 | 201.42 |
| අතිකාල දීමනා | 1,516,291.07 | 595,066.96 | 154.81 |
| විශේෂ දීමනා | 619,857.67 | 100,500.00 | 516.77 |
| සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල (ETF) | 154,057.96 | 40,622.78 | 279.24 |
| **කර්මාන්තශාලාවේ වියදම් සඳහා වෙන් කරන ලද මුදල** | | | |
| කෘමි පාලනය | 616,666.51 | 384,522.50 | 60.37 |
| රසායනික දුම් ගැසීම | 443,175.60 | 100,423.07 | 341.31 |

gamya wana karuṇu

<u>ගම්‍ය වන කරුණු</u>

- අයවැය ඉක්මවා යාම.
- මුදල් ප්‍රවාහ ගැටළුවට මුහුණ දීමට සිදු වීම.

<u>නිර්දේශය</u>

කාලීනව කළමනාකරණ ගිණුම් සකස් කර, සමාලෝචනය කිරීම සඳහා කළමනාකරණය සතුව විධිමත් ප්‍රතිපත්තියක් පැවතිය යුතුය.

10. <u>ක්‍රමවේද අත්පොත්හි පවත්නා හිඟකම</u>

සමාගම සතුව දැනට ක්‍රමවේද අත්පොත් නොමැත. ඉදිරි වර්ෂවලදී සිය මෙහෙයුම් විහිදුවාලීමට සමාගම විසින් අපේක්ෂා කරන හෙයින්, සංකීර්ණ සහ නැවත නැවතත් සිදු වන ගණුදෙණු සඳහා නිරවද්‍ය හා ස්ථාවර ගිණුම්කරණ පිළියම් තහවුරු කිරීම පිණිස, ක්‍රමවේද අත්පොත වැදගත් අවශ්‍යතාවක් වනු ඇත.

සමාගමේ එදිනෙදා මෙහෙයුම්වල වඩා වැදගත් මූල්‍ය සහ ගිණුම්කරණ අංශ හා ගණුදෙණු කිරීම සඳහා යෝග්‍ය අත්පොතක් සංවර්ධනය කළ යුතු බවට අපි යෝජනා කරන්නෙමු. මෙම අත්පොත, ඉතාමත් සංකීර්ණ නොවිය යුතු අතර, එය සකස් කිරීමේදී කාලය නාස්ති කිරීමක් ද සිදු නොවිය යුතුය. මෙම අත්පොත සියලුම සේවකයින් සඳහා ප්‍රයෝජනවත් පරිශීලන මාධ්‍යයක් ලෙස භාවිත කළ හැකිය. එමගින් සංවිධානය තුල ඒකීයභාවය සහ අඛණ්ඩතාව ස්ථාපිත කිරීම පිණිස මාර්ගෝපදේශනයක් සහ වත්මන් ක්‍රමවේද ඇගයීමේදී, නව ක්‍රමවේද සම්පාදනය කිරීමේදී ආධාරකයක් සපයනු ලබන අතර, නව කාර්යමණ්ඩල පුහුණු කිරීමේදී එය උපකාරී වන බව තහවුරු කළ යුතුය.

වඩාත් ඵලදායී වනු ලබන අටියෙන්, පහත සඳහන් කරුණු අවම වශයෙන් හෝ අත්පොතෙහි අන්තර්ගත විය යුතු බව අපි විශ්වාස කරන්නෙමු.

– වගකීම් ප්‍රකාශය සහ ගිණුම්කරණ කාර්යයන් පිළිබඳ සටහන
– තනතුරු, රාජකාරි සහ වගකීම් පිළිබඳ විස්තර
– ප්‍රමිතීන් හා නැවත නැවතත් සිදු වන සටහන් ඇතුලත් කිරීම් වැනි මූලික ගණුදෙණු පිළිබඳ විස්තර කිරීම් සහ නිරූපණය කිරීම් ඇතුලත්ව, අනුගමනය කරනු ලැබීමට නියමිත ක්‍රම, ක්‍රමවේද සහ පාලනය කිරීම් පිළිබඳ විස්තර
– ගිණුම් වගුව
– ක්‍රියාවලිගතකිරීමේදී සහ දත්ත ශීඝ්‍ර ලෙස සුවිගත කිරීමේදී භාවිත කරනු ලැබිය යුතු වෙනත් ආකාරයේ ප්‍රමිතිගත ලේඛන හෝ ආකෘතිපත්‍ර පිළිබඳ විස්තර

<u>කළමනාකරණ අදහස් දැක්වීම</u>

සමාගම විසින් ක්‍රමවේද අත්පොත සම්පාදනය කිරීම පිණිස පියවර ගනු ලැබ ඇති අතර, එම කාර්යය මේ වන විට ප්‍රගතිශීලී මට්ටමෙහි පවතී.